

ජෝන් සී. ලෙනොක්ස්

# කොරෝනාවයිරස ලෝකයක දෙවියන්වහන්සේ කොහිද?

“සදාතනික සත්‍යතාවයන් පිළිබඳ කාලෝචිත ආවර්ජනයකි. හෘදයාංගම ශෛලයකින්, ප්‍රඥාවන්තව සහ සැලකිල්ලෙන් යුතුව ලියමින්, ජෝන් ලෙනොක්ස්, අපි බොහෝ දෙනෙක් මේ මොහොතේ පොර බඳින බිය පිළිබඳ ප්‍රශ්න ආමන්ත්‍රණය කරයි.” **මයිකල් රැම්ස්ඩන්,** සභාපති, රවී සෙකරියා ජාත්‍යන්තර සේවය (RZIM)

“මේ කාලය සඳහා පැහැදිලි, දයානුකම්පාවෙන් පිරුණු සහ විවේචනාත්මක කියවීමකි. දැනටම අදහන්නන් හට තම ඇදහීම පිළිබඳ නව විශ්වාසයක් ගෙන දෙනු ඇත. තවම විශ්වාස නොකරන අය සොයා යන ඉතා ප්‍රධාන ප්‍රශ්න වලට පිළිතුරු ලැබෙනු ඇත.” **කීත් සහ ක්‍රිස්ටන් ගෙටී,** ගීත ප්‍රබන්ධකයින්

“පසුගිය මාස කිහිපය තුල ලෝකය වෙනස් විය. ජෝන් පොත් කිහිපයක් ලියා ඇතත්, එක සතියක් තුල මේ පොත මෙන්, කිසිදු පොතක් ලියා නැත. එහෙත්, මෙය කෙටි කාලයක් තුල ලියා හමාර කළද, මෙම පොත කොරෝනාවයිරස වසංගතය දෙස ඓතිහාසික, විද්‍යාත්මක, දේව ධාර්මීය සහ පෞද්ගලික දෘෂ්ඨි කෝණයක් තුලින් වඩාත් පුළුල් ලෙස මෙම ව්‍යසනය දෙස බැලීමට, එම තත්වය මැද සිටින අපට උපකාරයක් වෙයි.” **මහාචාර්ය ඩේවිඩ් ක්‍රෑන්ස්ටන්,** ඔක්ස්ෆඩ් විශ්ව විද්‍යාලයේ ශල්‍යවිකිත්සාව පිළිබඳ සහකාර කථිකාචාර්ය: ග්‍රීන් ටෙම්පල්ටන් විද්‍යාලයේ පාලන කායන සාමාක.

“ජෝන් ලෙනොක්ස්ගෙ හඬ තරම් පැහැදිලි සහ ප්‍රඥාගෝචර හඬක් බටහිර ලෝකයෙන් ඇසී නැත. මඳක් නැවති සිතීමට අවශ්‍ය අය, කියවිය යුතු පොත මෙයයි.” **ඔස් ගිනස්,** ග්‍රන්ථ කතෘ, *Unspeakable and Fool’s Talk*

ජීවිතය නවතාලීමට සමත් වූ ලෝක වසංගතයක් අත ළඟ තිබෙන මොහොතක අපි එය වටහා ගන්නේ කෙසේද? දෙවියන්වහන්සේ කොහේද? උන්වහන්සේ මෙවැනි දෙයකට ඉඩ හැරියේ මන්ද? මහාචාර්ය ජෝන් ලෙනොක්ස් විද්‍යාව පිළිබඳ තම ගැඹුරු දැනුම සහ ඔහුගේ තිරසාර ඇදහිල්ල එකට කැටි කරමින් අපගේ භයංකාර දුර්දසාව පිළිබඳ ආවර්ජනයක් කරයි. මෙම ගැඹුරු සහ ලෙහෙසියෙන් තේරුම්ගත හැකි පොත, සියළු ප්‍රශ්න වලට පිළිතුරු ඇත යයි ප්‍රකාශණයක් නොකරන අතර, අමාරු ප්‍රශ්න සැබවින්ම ආමන්ත්‍රණය කරමින්, අද අප ඉදිරියේ ඇති අභියෝග වලට එකාමෙන් මුහුණ පෑමට විශාල රැකුලක් ලබා දෙයි.” **ආචාර්ය පීටර් සැන්ඩර්ස්,** CEO, ජාත්‍යන්තර ක්‍රිස්තියානි වෛද්‍ය සහ දන්ත සංගමය (ICMDA).

පිළිගැනුම

මෙම ව්‍යාපෘතිය සඳහා නන් අයුරින් උපකාර කළ සියළු දෙනාට ස්තුති කිරීමට කැමැත්තෙමි: විශේෂයෙන් The Good Book Company හි වෙහෙස නොසලකන නිෂ්පාදක අධ්‍යක්ෂක ටිම් තෝර්න්බරෝ, එහි කතෘ අධ්‍යකෂක කාර්ල් ලැෆර්ටන් සහ මගේ සහකාර ගවේෂක, ආචාර්ය සයිමන් වෙලම්.

Where Is God in a Coronavirus World?
© John C. Lennox, 2020
Published by
The Good Book Company

thegoodbook.com | www.thegoodbook.co.uk
thegoodbook.com.au | thegoodbook.co.nz | thegoodbook.co.in
Unless otherwise indicated, Scripture quotations are from The Holy Bible, New International Version, NIV Copyright © 1973, 1978, 1984, 2011 by Biblica, Inc.
ISBN: 9781784985691 | Printed in the UK

Design by André Parker

කොරෝනාවයිරස ලෝකයක දෙවියන්වහන්සේ කොහිද?
© 2019 සිංහල පරිවර්තනය කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය විසිනි
Sinhala Translation © 2019 by Colombo Theological Seminary

සියලු අයිතිවාසිකම් කතුවරයා සතුය. කතුවරයාගේ අවසරය නොලබා මෙම කෘතියේ කිසිදු කොටසක් කුමන ආකාරයකින් හෝ කුමන ක්‍රමයකින් ඉලෙක්ට්‍රෝනිකව, යාන්ත්‍රිකව, ජායා පිටපත් මගින් සම්ප්‍රේෂණය සහ භාවිතය පිණිස කිසියම් පද්ධතියක සටහන් කිරීම, ගබඩා කිරීම සපුරා තහනම්.

Colombo Theological Seminary
189 Dutugemunu Street, Kohuwela, Sri Lanka
http://www.cts.lk
info@cts.lk

# පටුන


හැඳින්වීම 5

1. අනතුරුදායකය යන හැඟීම 7

2. ආසන දෙව්මැදුරු සහ ලෝකදෘෂ්ටීන් 14

3. අදේවවාදය උපකාරයක් වේවිද? 26

4. ප්‍රේමණීය දෙවි කෙනෙකු සිටිනවා නම් කොරෝනාවයිරසයක් තිබිය හැකිද? 39

5. ප්‍රේමය පිළිබඳ සාක්ෂි 54

6. දෙවියන්වහන්සේ ඇති කරන වෙනස 62

පසුවදන 77

**වේදනාවෙන් සිටින ලොවක් වෙත**

**පේසීචල්**

# හැඳින්වීම

අප දැන් ජීවත් වන්නේ සුවිශේෂී, යුගයක් අර්ථකථනය කරන වකවානුවකයි. නිශ්චිත යයි සිතූ දේවල් බොහොමයක් මෙන්ම, අප ලෝකය ගැන සිතා සිටි ආකාරය සහ අපගේ විශ්වාසයන් දැන් ඇත්තේ නැත.

ඔබ කිතුනුවෙකු වුවත් නැතත්, කොරෝනාවයිරස් වසංගතය මහත් ප්‍රහේලිකාවක් මෙන්ම සැම දෙනාම නොසන්සුන් කරන්නක් බවට පත්ව ඇත. අප මේ ගැන කල්පනා කරන්නේ සහ එයට සාර්ථකව මුහුණදෙන්නේ කෙසේද?

මෙම පොතෙහි සඳහන් වන්නේ මේ දැන් අප සැම මුහුණදෙන සිදුවීම් ගැන මගේ ආවර්ජනාවන්ය. මා මෙය ලිවීම ආරම්භ කළේ සතියකට කලිනි. එහෙත් මේ වන විට තත්වය ශීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතී. එසේම එය තවදුරටත් වෙනස් වනු ඇත. මෙහි සඳහන් වන්නේ මගේම අදහස් නිසා, ඒවා මා සම්බන්ධ වී සිටින විශ්වවිද්‍යාලයේ හෝ වෙනත් සංවිධානවල හෝ අදහස් ලෙස නොසැලකිය යුතුය. මෙහි බොහෝ විට රළු අදහස් සහ අඩුපාඩුකම් තිබෙන්නට පුළුවන. ඒ ගැන මම සමාව අයැද සිටිමි.

මෙම පොත මේ ආකාරයෙන් නිරීක්ෂණය කිරීමට මම ඔබට ආරාධනා කරමි: ඔබ සහ මා අවන්හලක

වාඩි වී සිටින විටෙක (එයත් දැන් කළ නොහැකිය!) පොතේ කවරයේ ඇති ප්‍රශ්නය ඔබ මගෙන් අහනවා. එවිට මා මගේ කෝපි කෝප්පය පසෙක තබා, ඔබට අවංක පිළිතුරක් දීමට උත්සාහ දරනවා. ඒ අනුව මෙහි සඳහන් වන්නේ කිසියම් අස්වැසිල්ලක්, ධෛර්යක් සහ බලාපොරොත්තුවක් ලබා දෙන පිණිස මා ඔබට පවසන වදන්ය.

# 1. අනතුරුදායකය යන හැඟීම

මෙය අතාත්වික මොහොතකි.

වසර හැත්තෑව පසු කර ඇති මා, මගේ භාර්යාව සමඟ මගේ නිවසේ රජයේ සෞඛ්‍ය නිලධාරියෙක් පවසන වචනවලට සවන් දෙමින් වාඩි වී සිටිනවා. ඔහු පවසන්නේ, ලොව පුරා පැතිර යන කොරෝනාවයිරසය (කොරෝනාවයිරස ගණනාවක් ඇති අතර මෙම වයිරසයට කෝවිඩ් 19 යන ආදේශ නාමය ලබා දී ඇත. මෙම පොතේ අප මෙය කොරෝනාවයිරසය ලෙස හඳුන්වන්නට යනවා) වැලඳීමෙන් වැළකී සිටීමට සමහර විට අපට මාස හතරක කාලයක් නිවාසවලට කොටු වී සිටීමට සිදු වන බවයි. මෙම වසංගතය එදා මෙදාතුර පැතුරුණු වසංගත අතරින් භයානකම වසංගතය වීමේ අවදානමක් ඇති බව සහ දැනට ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තු සමහර විට යථාර්ථය අසලකටවත් නොඑන්නට පුළුවන් බව ග්‍රහණය කර ගැනීම අසීරුය. එහි ප්‍රමාණය සහ විෂයපථය ත්‍රාසජනක චිත්‍රපටයක ස්වරූපයක් ගනී. එහෙත් මෙය ඇත්තෙන්ම සිදුවෙමින් පවතින්නකි.

මේ ආකාරයේ නගර, රටවල් සම්පූර්ණයෙන් අගුල් දැමීමක්, දේශ සීමා වසා දැමීමක්, ගමනාගමනය තහනම් කිරීමක්, අත්‍යවශ්‍ය සේවාවන් හැර අන් සියලු සේවාවන් අත්හිටුවීමක්, විශාල ක්‍රීඩා තරග කල් දැමීමක්

සහ නිසොල්මන් වූ නගරවලින් ඇසෙන හීතියේ සහ ස්වයං හුදෙකලාවේ හඬක් අප මීට පෙර කිසිදාක අත්දැක නැත. වසංගතය පැතිරී යන වේගය නිසා ජාතික සෞඛ්‍ය සේවාවන්වලට දරාගත නොහැකි බරක් පැටවී ඇති අතර, ඊට මුහුණදීමට අත්‍යවශ්‍ය සම්පත් නිෂ්පාදනය වෙනත් කිසිදාක නොවූ විරූ ලෙස ඉක්මන් කිරීමට සිදු වී ඇත.

චීනයේ ආරම්භ වූ මෙම වසංගතයේ මධ්‍යලක්ෂ්‍යය බවට යුරෝපය පත්ව ඇත.[1] එක පැත්තකින්, රූපවාහිනී ප්‍රවෘත්තිවලින් හිස් පාරවල්, හිස් සුපිරි වෙළඳසැල්, හිස් ක්‍රීඩාංගණ සහ හිස් දේවස්ථාන අපට පෙන්වන අතර, තවත් පැත්තකින් පිරී ඉතිරී ගොස් ඇති රෝහල් සහ ඒවායෙහි ඇඳන් සඳහා විශාල ඉල්ලුමක් ඇති බවට පෙන්වයි. එසේම රැකියා සහ ව්‍යාපාර අනතුරුදායක තත්වයක පවතී. මුළු ලොවම බියෙන් වෙළී ඇති අතර, තවදුරටත් බොහෝ දෙනා රෝගයට ගොදුරු වත්ම, බිය එන්න එන්නම වැඩි වේ.

එහි ප්‍රධාන ප්‍රතිඵලයක් නම් මුළු ලොවෙහිම අන්තරාදායකය යන හැඟීමේ වැඩි වීමය. අපි බොහෝ දෙනෙක්, සාමාන්‍යයෙන් ජීවිතය පිළිබඳ පෙරනිමිති පළ කළ හැකි ස්ථාවර ලොවකට පුරුදුව සිටියෙමු. එහෙත් දැන් ඒ සියල්ල කඩා වැටෙමින් පවතී: අප ප්‍රත්‍යක්ෂ වශයෙන් විශ්වාස කළ දේවල් දැන් අහිමි වී තිබෙන අතරම, අපටම පාලනය කරගත නොහැකි බලවේගවලට දැන් අපි නතු වී ඇත්තෙමු. මිනිස්සු තම ශාරීරික මෙන්ම මානසික සෞඛ්‍යය ගැනත් බියෙන් පසු වෙති. ඔවුන්ගේ පවුල් සහ මිතුරන් ගැන, විශේෂයෙන්ම

වයෝවෘද්ධ අය සහ රෝගී වූ අය ගැන; තම සමාජ ජාලා ගැන, ඔවුන්ගේ ආහාර සැපයුම් ගැන, ඔවුන්ගේ රැකියා සහ ආර්ථික සුරක්ෂිතතාව ගැන, මෙන්ම වෙනත් බොහෝ දෑ ගැන මිනිස්සුන් වික්ෂිප්ත වී සිටිති.

මෙවන් අස්ථිර සහ චංචල තත්වයන් හමුවේ සමානුපාතය නැති වී යාම ඉතාම පහසුය. මන්ද, අප සාමාන්‍යයෙන් වාර්ෂිකව උණ රෝගයෙන් මිය යන සංඛ්‍යාව පිළිගැනීමට අපහසුතාවයක් ඇති සෙනඟකි. පසුගිය වසර පහ තුළ වසරකට මිනිසුන් 17000ක් උණ රෝගයෙන් මිය ගොස් ඇති බවට එංගලන්ත සෞඛ්‍ය බලධාරීන් ඇස්තමේන්තු කර ඇත; ඇමෙරිකාවේ රෝග පාලන සහ නිවාරණ මධ්‍යස්ථානය 2019 ඔක්තෝම්බර් සිට 2020 මාර්තු දක්වා මෙම සංඛ්‍යාව 23000 - 59000 අතර යයි ප්‍රකාශයට පත් කර ඇත. පසුගිය වසරේ පමණක් ලොව පුරා මහ පාරවල්වල මිනිසුන් මිලියන 1.35ක් ජීවිතක්ෂයට පත් වූ බවට ඇස්තමේන්තු කර ඇත. එහෙත් කොරෝනාවයිරසය මේ සියල්ලටම වඩා අප බියපත් කර ඇත්තේ එමගින් සිදු වන මහා පරිමාණ මරණ සංඛ්‍යාවේ වර්ධනයත්, ඉදිරියේදී ගණනය කළ නොහැකි තරම් මිනිසුන් සංඛ්‍යාවක් මරණයට පත් විය හැකි බවට ඇස්තමේන්තු කර තිබීමත් නිසාය. ඔබ මෙය කියවන අවස්ථාවේදී මරණ සංඛ්‍යාව තවත් ඉහළ ගොස් ඇති බවට මට කිසිදු සැකයක් නැත.

ඇමෙරිකානු ජාතික සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ෆ්‍රැන්සිස් කොලින්, ද ඇට්ලාන්ටික් සඟරාව සමඟ සම්මුඛ සාකච්ඡාවකදී මෙම වයිරසය පිළිබඳ ඔහු බෙහෙවින් පුදුමයට පත් කළ කාරණය කියා සිටියේය:

*"මෙහි සම්ප්‍රේෂණය සාර්ස්වලට වඩා වේගවත්ය. වසර 18කට පෙර සාර්ස් නිසා ලෝකය බියෙන් ඇලලී ගියේය. එහෙත් එයින් දැන් සිදු වන ආකාරයේ ආසාදන තත්වයක් හෝ මරණ සංඛ්‍යාවක් වාර්තා නොවීය. ඊට හේතුව එය මෙතරම් ඉක්මනින් සම්ප්‍රේෂණය නොවීමය. එහි සම්ප්‍රේෂණය සිදු වූයේ බොහෝ සේ රෝගී වූ අයගේ මාර්ගයෙන් පමණි. එහෙත් මෙය සුළු රෝග තත්වයක් ඇති අය අතරත්, කිසිදු රෝගයක් නැති අය අතරත් සම්ප්‍රේෂණය වෙයි"*[2]

අපි මේ සියලු දේවලට දැක්විය යුත්තේ කුමන ආකාරයේ ප්‍රතිචාරයක්ද? කිසියම් සමානුපාතයකට එළඹීමටවත් පුළුවන්කමක් ඇද්ද? සංත්‍රාසය සහ භීතියට පත් වීමෙන් අප වැළකී සිටින්නේ කෙසේද?

## අපි මීට පෙර මෙතැන සිටියෙමු

අතීතයේදීද මෙවැනි වසංගත තිබුණි. ලොව මුල්ම වසංගතය ලෙස වාර්තා වන්නේ ඇන්ටොනින් වසංගතය හෙවත් ක්‍රි.ව. 165 - 180 අතර කාලයේ පැතිරුණු ගේලන් වසංගතයයි. එම රෝගය කුමක්දැයි නිශ්චිතවම කිව කොහැකි වුවද, එය සමහර විට සරම්ප හෝ වසූරිය විය හැකිය; එමගින් මිනිසුන් මිලියන පහකට මරණය ළඟා කෙරුණි. ඊළඟට වාර්තා වන්නේ ජස්ටිනියානු වසංගතයයි (ක්‍රි.ව. 541-542). මෙය සත්ත්වයන් (මීයන්) මත සිටි මැක්කන්ගෙන් සම්ප්‍රේෂණය වූ කුද්දිටි ඉදිමීමේ වසංගතයක් ලෙස සැලකේ. එහිදී මිලියන 25ක් මැරුණු

බවට ගණන් බලා ඇත.

තවත් කළු මරණය ලෙස හැඳින්වූ එවැනිම වසංගතයක් 14 වන ශතවර්ෂයේ (1346-1353) අතර කාලයේ පැතිරී, මිලියන 70ක් සහ 100කට ආසන්න යුරේෂියාවේ සෙනඟ ප්‍රමාණයක් මරණයට පත් වූහ. එහිදී ලෝක ජනගහනය 20%කින් අඩු විය.

ඊට සෑහෙන කාලයකට පසුව, 19 සහ 20 වන ශතවර්ෂවල කොළරා වසංගත තත්වයන් කිහිපයක්ම පැවැති අතර, ඒවායින් මිලියනයක් පමණ ජනතාව මරණයට පත් වූහ. ඉන්ෆ්ලූවෙන්සා වසංගතයකින් මිලියන 20ක්-50ක් අතර ජනතාවක් මරණයට පත් වූයේ 1918- 1920 වර්ෂවලදීය. මගේම ජීවිත කාලය තුළදී, 1956-1958 අතර කාලයේ, ආසියානු උණ රෝග යකින් මිලියන දෙකක්ද, තවත් මිලියනයක් 1968-1969 අතරතුර, හොං කොං උණ රෝගයෙන්ද ජනතාව මිය ගියහ. HIV/AIDS වසංගතයෙන් 2005 සහ 2012 අතර කාලය තුළදී මිලියන 32ක් ජනතාව මරණයට පත් වී ඇත.[3]

මේ සියල්ලක්ම වසංගත ලෙස ප්‍රකාශයට පත් වූ ඒවාය. මීට අමතරව වසංගත ලක්ෂණ ඇතත් වසංගත ලෙස නම් නොකෙරුණු ඉබෝලා සහ සාර්ස් වැනි භූගෝලීය වශයෙන් එක්තරා ප්‍රදේශයකට පමණක් සීමා වූ ජනපද රෝගද පැවතිණි. මීට වසර 120කට පෙර, උණ, ක්ෂයරෝගය, කොලරාව ආදී බෝ වන රෝග සමග බටහිර ලෝකය ජීවත් වූයේ එය ජීවිතයේ සාමාන්‍ය කොටසක් වශයෙන් සලකාගෙනය.”

කොරෝනාවයිරසය, කුද්දිට් ඉදිමීමේ වසංගත ආකාරයටම, සතුන්ගෙන් ආරම්භ වී මිනිසුන් අතරට සම්ප්‍රේෂණය වූ බවට සිතිය හැකිය.

එහෙත් මෙය 21 වන ශතවර්ෂයයි: මෑත කාලයේදී රෝග ගැන මෙන්ම ඖෂධ ගැනද විශාල දියුණුවක් අත්පත් කරගෙන ඇති බැවින් මේ වන විට වසංගත ඉතිහාසයට පමණක් සීමා වූවක් යැයි බොහෝ දෙනෙක් සිතාගෙන සිටින්නට ඇත. එහෙත් එය එසේ නොවන බව අපට වැටහී යයි. එබැවින් මෙම අලුත් තත්වයට අප මුහුණදෙන්නේ කෙසේද?

## දෙවියන්වහන්සේ ඉන්නවාද?

අතීතයේදී, ජාතික ව්‍යසනවලදී බටහිර රටවල මිනිසුන් සභාවන්වලට එක්රොක් වන්නට පටන්ගත් අතර, ජාතික නායකයෝ යාච්ඤාව සඳහා ආරාධනාවන් නිකුත් කළහ. මේ වන විට ජාතික නායකයින් අතලොස්සක් සහ ලොව පුරා සභා නායකයින් යාච්ඤාව සඳහා කැඳවීම් නිකුත් කර ඇතත්, එවැනි සිදුවීම් අද හිඟය. මොගොං, දකුණු අප්‍රිකාවේ අග්‍ර විනිශ්චයකාරතුමා අමතක නොවන ඉල්ලීමක් සිදු කළේය: “මගේ මේ කැඳවීම යාච්ඤා කිරීමේ හැකියාව ඇති සියලු දෙනාටයි. එය අත්‍යවශ්‍ය කාරණයක් ලෙස සලකා අද පටන් යාච්ඤාව ආරම්භ කරන්න.”[4]

වර්තමානයේ තම ජීවිත තුළ කිසියම් ආකාරයක දේව සංකල්පයක් ඇති මිනිසුන්ගේ ගණන අඩු වෙමින් පවතී. වයිරසය පැතිරීම අවම කිරීම සඳහා ලොව

පුරා දේව ගෘහයන් වසා දැමීමට සිදුව ඇති වෙලාවක, දෙවියන්වහන්සේ කොහේදැයි මිනිස්සු අසති - එනම්, උන්වහන්සේ සිටින්නේ ස්වයං-නිරෝධායනය වී අපට ළං වෙන්න බැරි තැනකද? සැබවින්ම බලාපොරොත්තුවක් හෝ සහනයක් ලබා ගැනීම උදෙසා අප යා යුතු වන්නේ කා වෙතටද? කොහේටද?

# 2. ආසන දෙව්මැදුරු සහ ලෝකදෘෂ්ටීන්

ව්‍යසනයක් සිදු වූ විට අපි කවුරුත් සොයන්නේ බලාපොරොත්තුවකි. 2020 මාර්තු 10 වන දින නිව්යෝර්ක් ටයිම්ස් පුවත්පතේ ඉතාලි ජාතික පුවත්පත් කලාවේදියෙක් වන මැෂියා ෆෙරාරෙසි මෙසේ ලියා ඇත:

*"ශුද්ධ වතුර සනීපාරක්ෂක දියරයක් නොවෙයි, යාච්ඤාව එන්නතක් නොවෙයි... එහෙත් අදහන්නන්ට, ආගම ආත්මික සුවය සහ බලාපොරොත්තුව ලැබෙන ප්‍රධානතම මූලාශ්‍රයයි. එය, මානසික සහ භාවාත්මක පිහිටාධාර සපයන, සෞඛ්‍යසම්පන්නභාවය ළඟා කර දෙන, සුන් වූ බලාපොරොත්තුවලට ඖෂධයක් බඳුය (තවද, මහත් කනස්සල්ලට තුඩු දෙන, අපගේ කාලයේ ප්‍රශ්නයක් ලෙස බොහෝ වෛද්‍ය විශේෂඥයින් සලකන, තනිකමටද ප්‍රතිජීවකයකි.)"*

*"තවද, ආගම, නමස්කාර කරන්නන් හට, පරම අර්ථයක් ගෙන දෙන මූලාශ්‍රයයි. සෑම ආගමක්ම උත්සහා කරන්නේ සිදු වන්නාවූ දෙවල්වලට අර්ථයක් දීමටයි. විශේෂයෙන් දුක සහ විපත්ති තේරුම් ගැනීමට උපකාරයක් වීමටයි. එවන් අදහස් ගම්භීර ලෙස පිළිගත් කල, කිසිදු උසස් හේතුවක් නැති ශාරීරික සෞඛ්‍යය සම්බන්ධව පවා අපට දැනෙන්නේ හිස් බවකි."*[5]

ජීවිතය අප සිතන ආකාරයටම ගලා යන විට සහ සියල්ල අපගේ පාලනය යටතේ ඇති විට, අමාරු ප්‍රශ්න ඇසීමේ අවශ්‍යතාවයක් එළඹෙන්නේ නැති නිසා, අප සරල පිළිතුරුවලින් සෑහීමකට පත් වනවා. එහෙත් දැන් හැමෝටම ජීවිතය ඊට වඩා වෙනස්. අපගේ ඇදහීම හෝ විශ්වාසයන් කුමක් වුවත්, අමාරු ප්‍රශ්න, අපගේ අවධානය ඉල්ලා උඩට මතු වෙන්න පටන් අරගෙන තිබීම පුදුමයට කාරුණක් නොවේ.

කොරෝනාවයිරසය දුක සහ වේදනාව නමැති ප්‍රශ්නය අප ඉදිරියට ගෙනැවිත් තිබෙනවා. මෙය, අපෙන් සමහරෙකුට ජීවිතයේ අමාරුම බරපතල ප්‍රශ්නවලින් එකක්. මේවාට සමහරෙක් ඉදිරිපත් කරන ඉතා සරල සහ පහසු පිළිතුරු සැක සහිත බව අප අත්දැකීමෙන් දන්නවා.

මා උත්සහා කරන්නේ, එවන් "පිළිතුරුවලින්" බැහැරව, හැකිතාක් දුරට අවංකව කොරෝනාවයිරසය සමග පොරබැදීමේදී මට උපකාරී වූ අදහස් කිහිපයක් ඔබ සමඟ සාකච්ඡා කිරීමටයි.

## දිරාපත් වූ ආසන දෙව් මැදුරු

වේදනාව ගැන ඇති තරම් පොත් තියෙද්දී, ඒ ගැන ලියවුණු තවත් පොතක් අපට අවශ්‍යද යනුවෙන් සමහර විට ඔබ අසනු ඇත: ඊට පිළිතුරු වශයෙන්, ඒ පොත් බොහෙමයක්ම වගේ කථා කරන්නේ සදාචාරාත්මක පාපය ගැන යයි මා කියනවා. මෙම පොත ස්වාභාවික පාපය ගැන කථා කිරීමට යොමු වෙනවා. ඒ කියන්නේ

මා අවධානය යොමු කරන්නේ බිඳුණු ස්වභාවය ගැනයි - එනම් මූලික වශයෙන් කොරෝනාවයිරසය පිළිබඳවත්, ඒ වගේම සියලු ආකාර රෝග සහ භූමිකම්පා සහ සුනාමි වැනි ස්වාභාවික ව්‍යසන සහ විපත්ති ගැනත්ය.

දුක සහ වේදනාව පැමිණෙන්නේ ප්‍රභව දෙකකිනි.

මුලින්ම, ස්වාභාවික ව්‍යසන සහ රෝග නිසා වේදනාව ඇති වන අතර, භූමිකම්පා, සුනාමි, පිළිකාව සහ කොරෝනාවයිරසය වැනි දේවලට මනුෂ්‍යයා සෘජුව වගකිව යුතු නැත. මීළඟට අපි දුක පිළිබඳ ප්‍රශ්නය නොහොත් ස්වාභාවික පාපය නමැති ප්‍රශ්නය වෙත යොමු වන්නෙමු. මෙහි පාරිභාෂික වචනවල තරමක අභාග්‍ය සම්පන්නකමක් ඇත. මන්ද, “පාපය” නමැති වචනය තුළ කිසියම් සදාචාරාත්මක වචනාර්ථයක්ද ගැබ් වී පවතින නමුත්, භූමිකම්පා හෝ කොරෝනාවයිරස සදාචාරාත්මක කාරකයන් නොවේ.

දෙවනුව, ද්වේශසහගත ක්‍රියා, භීතිය, ප්‍රචණ්ඩත්වය, අපයෝජනය සහ මිනී මැරුම් වැනි මනුෂ්‍යයන් සෘජුවම වගකිව යුතු වේදනාවන්ද ඇත. මෙය අප සදාචාරාත්මක පාප ප්‍රශ්නය වෙතට ප්‍රවිෂ්ට කරයි.

නවසීලන්තයේ ක්‍රිස්තුදේව ආසන දෙව් මැදුර, එංගලන්තයේ කවෙන්ට්‍රි ආසන දෙව් මැදුර, ජර්මනියේ ඩ්‍රෙස්ඩන්හි ෆ්රොවන්කර්ෂර් ආසන දෙව් මැදුර මෙම ප්‍රශ්න දෙක විදහා දක්වන බලවත් මෙන්ම ඛේදජනක සංකේත දෙකකි. මෙම නටබුන් බවට පත් වූ දෙව් මැදුරු කරුණු දෙකක් පිළිබඳ සාධක පෙන්නුම් කරයි. එක අතකින්, ඒවා තුළ තිබුණු සුන්දරත්වය

සහ රුචිකත්වය ගැන සාධක අපට දැකගත හැකිය. ඒ වගේම මහත් ව්‍යසනයක අනුවේදනීය කැළැල්ද ඒවායින් පෙන්නුම් කෙරේ. ක්‍රිස්තුදේව ආසන දෙව් මැදුර භූමිකම්පාවක් නිසාද, කවෙන්ට්‍රි සහ ඩ්‍රෙස්ඩන් දෙව් මැදුරු බෝම්බ නිසාද නටබුන් බවට පත් විය. මේ නටබුන් වූ ආසන දෙව් මැදුරු තුළින්, සෞන්දර්ය සහ විනාශය සම්මිශ්‍රණය වූ චිත්‍රයක් පින්තාරු කෙරෙයි.

මේවා එක්ව අපට මතක් කර දෙන්නේ ව්‍යසනයන් නිසා මතු වන ගැඹුරු කෙළවරක් නැති ප්‍රශ්නවලට පහසු පිළිතුරු නැති බවය. එවන් අවස්ථාවල බොහෝ දෙනා ඉදිරිපිට මැවෙන්නේ කඩතොලු වූ රළු චිත්‍රයකි. වේදනාවේ හරි මැද සිටින අයගෙන් දුරස්ව සිටින අපෙන් සමහරෙකුට ඒ අයගේ වේදනාව ගැන ප්‍රමාණවත් ලෙස සංවේදි වීමට නොහැකි වීමේ අවදානමක් ඇත.

කෙසේ වෙතත් ක්‍රිස්තුදේව ආසන දෙව් මැදුර සහ කවෙන්ට්‍රි ආසන දෙව් මැදුර අතර වෙනසක් ඇත. ක්‍රිස්තුදේව ආසන දෙව් මැදුර විනාශ වූයේ භූමිකම්පා කාරකවල චලිතවීම නිසාය. කවෙන්ට්‍රි සහ ඩ්‍රෙස්ඩන් දෙව් මැදුරු විනාශ වූයේ යුද්ධය නිසාය. සමහරු ක්‍රිස්තුදේව ආසන දෙව් මැදුරේ විනාශය 9/11 විනාශය හා සංසන්දනය කිරීමට උත්සාහ කළේ එවැනි ආකාරයේම කම්පන තරංග දේශය පුරා පැතිර ගිය බැවිනි: එහෙත් මෙහි ප්‍රධාන වෙනස්කමක් ඇත. ද්විත්ව කුලුනුවල විනාශය ස්වාභාවික ව්‍යසනයක් නිසා සිදු වූවක් නොවේ: එය සදාචාරාත්මක විනාශයක් හේතුවෙන් සිදු වූවකි. එය මනුෂ්‍ය පාපයේ ප්‍රතිඵලයකි. භූ කම්පන වූ කලි ස්වාභාවික ව්‍යසනයක් මිස, සදාචාරාත්මක

විනාශයක් නොවේ.

එහෙත් සමහර විට සදාචාරාත්මක විනාශයන් සහ ස්වාභාවික පාපය අතර සම්බන්ධයක් ඇත. මේවායින් එකක් අනෙකට මගපාදන්න පුළුවන් බැවින් තත්වය තවත් ව්‍යාකූල වෙන්න පුළුවන්: වාණිජ්‍ය කටයුතු සඳහා ඉවක් බවක් නැතුව කැලෑ එළපෙහෙළි කිරීම නිසා කාන්තාර වර්ධනය වීමත්, ඒ හේතුව නිසා මන්දපෝෂණය සහ ලෙඩ රෝග වැඩි වීමත් සිදු විය හැකිය. එහෙත් කොරෝනාවයිරසය පැතිරීම පෙනෙන හැටියට ස්වාභාවික පාපයක් ලෙස පෙනී යයි (එනමුත් සදාචාරාත්මක පාපය ආත්මාර්ථකාමී අධික ලෙස රැස්කිරීමේ වේගයෙන් ඒ පිටුපසින්ම පැමිණෙන්නේය). ඒ අනුව කුමන්ත්‍රණ මතධාරීන් කෙසේ හෝ කිසියම් මිනිස් කාරකයක් මත මෙහි වරද පැටවීමට උත්සාහ කරනු ඇත. වයිරස් සම්ප්‍රේෂණයට මිනිසුන් සම්බන්ධය, එහෙත් එය උවමනාවෙන්ම හෝ ආත්මාර්ථකාමීත්වය නිසා සිදු වන්නක් නොවේය - ප්‍රධාන පූර්ව නිගමනය වූයේ වයිරසය සතුන්ගෙන් මිනිසුන්ට සම්ප්‍රේෂණය වූ බවය.

කරුණු එසේ වුවද, චීන බලධාරීන් භයානක නව වසංගතයක් පිළිබඳ වාර්තා සැඟවීමට උත්සහායක යෙදුණු බවට සාධක මතුව ඇත. හොංකොං හි ගාර්ඩියන් පුවත්පතේ 2020 මාර්තු 11 දින, ලිලි කුඕ මෙසේ වාර්තා කළාය:

*"චීන රජය විසින් ලෝක සෞඛ්‍ය සංවිධානයට වාර්තා කළ ආකාරයට පළමු ආසාදිත පුද්ගලයා*

*හඳුනාගන්නා ලද්දේ දෙසැම්බර් මස 8 වනදාය. එම මාසයේම පශ්චාත් භාගයේදී නව රෝගයක් සම්බන්ධයෙන් තම සගයින්ට අනතුරු ඇඟවූ චීන ජාතික වෛද්‍යවරුන්ට තදින් තරවටු කරන ලදී. එය මිනිසාගෙන් මිනිසාට සම්ප්‍රේෂණය වන බව ජනවාරි 21 වන දා තෙක් බලධාරීන් පිළිගත්තේ නැත."*[6]

කනගාටුදායක කරුණ නම්, 2019 දෙසැම්බර් මාසයේදී වයිරසය පිළිබඳ තොරතුරු හෙළි කිරීම හේතුවෙන් චීනයේ වීරවරයෙක් ලෙස සමරනු ලැබූ, වුහාන්හි අක්ෂි විශේෂඥ දොස්තර ලී වෙන්ලියැන්ග් මහතාද, මාස දෙකක් ඇතුළතදී එම වයිරසයම ආසාදනය වීමෙන් මරණයට පත් විය.

කොරෝනාවයිරසය පිළිබඳ විවිධ රටවල් දක්වන්නට යෙදුණු ප්‍රතිචාර සම්බන්ධයෙන් චෝදනා සහ ප්‍රතිචෝදනා ඉදිරියේදී අපට දැනගන්නට ලැබෙනවා නොඅනුමානය. එහෙත් මේ එකක්වත් මෙම අර්බුදයට මුහුණදීමට හෝ ඊට පෞද්ගලිකව ප්‍රතිචාර දක්වන ආකාරය දැනගැනීමට අපට උපකාරයක් නොවනු ඇත.

අපගේ දෘෂ්ටිකෝණය අප දක්වන්නට යන ප්‍රතිචාරවලට පාදක වන්නට හේතු වෙයි. දැඩි සත්කාර ඒකකයක් තුළ ජීවිතයත් මරණයත් අතර සටනේ සිටින වයෝවෘද්ධ කාන්තාවට කොරෝනාවයිරසය පෙනෙන ආකාරයත්, ඇයට වෙදකම් කරන වෛද්‍යවරයාට එය පෙනෙන ආකාරයත්, ඇය බලන්ටවත් නොලැබෙන ඇගේ පවුලේ අයට සහ ඇයට උපකාර කිරීමට බැරිව ලත වන ඇයගේ සහාපාලකතුමාට එය පෙනෙන

ආකාරයත් එකිනෙකට වෙනස්ය. තවද, අපට මෙය වැලඳී ඇත්ද, වැලඳී තිබුණාද, අපෙන් තව කෙනෙකුට රෝගය සම්ප්‍රේෂණය විය හැකිද, දැනටම එසේ වී ඇත්ද යන කාරණා නිසා බොහෝ දෙනෙක් සංවේග යෙන් පසු වෙති.

අප හැම කෙනෙකුටම තුන් ආකාරයකට, එනම් බුද්ධිමය, භාවාත්මක සහ ආත්මික ආකාරයෙන් කොරෝනාවයිරසය තේරුම් ගැනීමට සිදු වෙයි. මේ සියල්ලම එකට ගත් කල, ඕනෑම කෙනෙකුට ඒ තුළින් විශාල අභියෝගයක් එල්ල වෙයි.

අප හැම දෙනාටම බුද්ධිමය පැහැදිලිතාවය අවශ්‍ය වන බැවින් බොහෝ දෙනා, මේ සිදු වන දේවල් ගැන වැටහීමක් ලබාගැනීමේ බලාපොරොත්තුවෙන් පැය ගණන් රූපවාහිනියේ ප්‍රවෘත්ති බලමින් සහ අන්තර්ජාලයේ සැරිසරමින් කාලය ගත කරති. එනමුත් බුද්ධිමය තොරතුරු, ගලා යන කඳුළු නැවැත්වීමට සමත් වන්නේ නැත. එසේ නම්, මෙවැනි විනාශකාරී සහ වෙනස් කළ නොහැකි සිදුවීම් පිළිබඳ කිසියම් අර්ථයක්, නොඑසේනම් බලාපොරොත්තුවක්වත් ලබා ගන්නේ කොසේද? ගැඹුරු ප්‍රශ්න නොනවත්වාම ප්‍රවාහයක් සේ ගලා එයි, සමහර විට මෙය කියවන ඔබේ අත්දැකීම එය වන්නට පුළුවන. ඇයි මේ වගේ දෙයක් මට සිදු වුණේ, නැත්නම් ඔවුන්ට සිදු වුණේ? ඇයි මම ඉතුරු වෙලා ඔවුන් පමණක් ආසාදනය වී මිය ගියේ? මට දැනෙන මේ තදබල ශාරීරික සහ මානසික වේදනාව මම නැති කර ගන්නේ කොහොමද? මට බලාපොරොත්තුවක් තියෙනවද?

## වේදනාවේ කාර්යභාරය

අපගේ ජීවිත තුළ වේදනාවට ඇති වටිනාකම කෙබඳුදැයි මානව අත්දැකීම සහ ප්‍රාථමික වෛද්‍ය විද්‍යාව, අපට උගන්වා ඇත. වේදනාව මුලින්ම අපට අනතුරු අඟවයි. නිදසුනක් ලෙස ඔබගේ අත ගින්දරට බොහෝ සේ ළං කළ විට, ඔබගේ ස්නායු පද්ධතිය ඒ ගැන ඔබගේ මොළය දැනුවත් කළ නිසා ඔබට වේදනාවක් දැනෙනවා. ඒ නිසා ඔබ ඉක්මනින්ම අත ඉවතට ගෙන විශාල හිංසාවකින් ආරක්ෂා වනවා. මේ නිසා වේදනාව සම්පූර්ණයෙන්ම නරක දෙයක් යැයි අපට කිව නොහැකිය.

දෙවනුව, ශාරීරික වර්ධනයට තරමක වේදනාවක් ඉවහල් වෙයි. නිදසුනක් ලෙස, ක්‍රීඩාවේ උසස් මට්ටමට ළඟා වන පිණිස, කඳු තරණය කරන්නන්, ඇමෙරිකන් පා පන්දු, බ්‍රිතාන්‍ය රග්බි සහ මල්ලවපොර ක්‍රීඩකයන් ඉමහත් වේදනාවන් තුළින් යා යුතුමය.

තුන්වෙනුව, වඩාත් ගැඹුරු තලයක, චරිතය ගොඩනැඟීම සඳහාද දුක සහ වේදනාව නැතුවම බැරිය. දුක් වේදනා හමුවේ ඔරොත්තු දීමේ හැකියාවෙන් සහ ධෛර්යයෙන් යුතුව ඒවාට අභීතව මුහුණදුන් බැවින් අතිශයින් ශ්‍රේෂ්ඨ චරිත ගොඩනැඟුණු ආකාරය ගැන ඕනෑතරම් සාධක ඇත. රුසියානු කර්තෘවරයෙක් වූ ෆියඩෝර් ඩොස්ටොයෙව්ස්කිගේ නිබන්ධන චරිතය රැස්කෝනිකොව් පවසන දේ සත්‍යයක් නම්, වේදනා නොවින්ද ශ්‍රේෂ්ඨ මිනිසෙක් ගැන හිතාගන්නවත් බැරිය. “විශාල ප්‍රඥාවක් සහ ගැඹුරු හදවතක් සඳහා

වේදනාව සහ දුක් විඳීම අනිවාර්ය වේ."[7]

දෙමාපියෝ මේ දේ හොඳාකාර ලෙස දනිති. ඔවුහු තම දරුවාට වේදනාකාරී අත්දැකීමක් තුළින් යාමට ඉඩ හරින්නේ, තමන්ගේම අත්දැකීම්වලට අනුව එය අවසානයේදී දරුවාට මහත් ප්‍රතිලාභ ගෙන දෙන්නක් වන බව දන්නා බැවිනි.

මා මේ දේ ගැන වැඩිදුර නොදන්නවා විය හැකි වුවත්, මා මගේම අත්දැකීමෙන් කථා කරන්නම්. වසර කිහිපයකට පෙර මගේ හෘදයවස්තුවේ ඇති වූ වේදනාවක් නිසා කිසියම් දෝෂයක් ඇති බව මට තේරුම් ගියා. මා රෝහල වෙත ගෙන ගිය පසු තත්වය කෙතරම් බරපතලද කිවහොත්, මට මගේ බිරිඳට ආයුබෝවන් කියන්නට සිදුවුණා. එහෙත් දක්ෂ වෛද්‍ය මැදහත්වීම් කරණකොටගෙන දරුණු හෘදයාබාධයකින් මා අනූ නවයෙන් බේරුණා. ඒක හරියට මගේ හෘදය තුළ භූමිකම්පාවක් හට ගත්තා වැනියි.

එවැනි අත්දැකීමකට මුහුණදුන් කෙනෙක් නොවෙනස්ව සිටින්නේ නැත. එමගින් මට බොහෝ දේ උගන්වනු ලැබුවා. මා මැරෙන සුළු මෙන්ම අනතුරුවලට භාජනය විය හැකි කෙනෙකු බව මා ඉගෙන ගත්තා; මට නැවත වතාවක් ත්‍යාගයක් ලෙස ජිවිතය ලබා දෙන ලද්දේ වටිනා වස්තුවක් ලෙස එය රැක ගන්නා පිණිස යයි මට දැන් හැඟෙනවා. ඒ තුළින් මගේ ජිවිතයේ පරමාර්ථයට සහ කැඳවීමට වඩාත් වැදගත්කමක් එක් කරනු ලැබුවා.

## ආපදාවන් සහ ලෝකදෘෂ්ටීන්

මගේ හෘදයාබාධය සම්බන්ධ අත්දැකීම සිදු වූ කාලය තුළදීම මගේ සොහොයුරියගේ අවුරුදු 22ක් වයසැති මෑතකදී විවාහ වූ දියණිය මොළයේ දරුණු ගෙඩියක් හටගෙන මරණයට පත් වූවාය. මම මගේ සුවය ගැන දෙවියන්වහන්සේට ස්තුති කරන අතරම, මගේ සොහොයුරියට දෙවියන්වහන්සේ ගැන කුමක් කියම්ද? කිසිදු ආකාර ධනාත්මක පැතිකඩක් පෙනෙන තෙක් මානයකවත් නැති කොරෝනාවයිරසය වැනි වසංගතයක් අතරතුර මම දෙවියන්වහන්සේ ගැන කුමක් කියම්ද? සී. එස්. ලූවිස් වරක් ලියුමක් ලියමින් කියූ දෙයක් මේ අවස්ථාවේදී අනුනාද දෙයි:

> *"මුළු මහත් මැවිල්ලේ ගාවිනාව අප සමඟ බෙදා ගන්නා පිණිස මෙලොවට බට දෙවියන්වහන්සේම, තෝරා ගැනීමට නිදහස ඇති, පරිමිත මැවිල්ල දේවත්වයට හරවන පිණිස අවශ්‍ය වන බව විශ්වාස කරන්න අසීරුයි."*[8]

මෙම ලැයිස්තුවට දැන් අපට කොරෝනාවයිරසයත් ඇතුළත් කළ හැකියි. එම ලිපිය ලියන ලද්දේ වරක් අදේවවාදියෙක්ව සිටි, ජීවිතයේ මැද භාගයේදී කිතුනුවෙක් බවට පත් වූ, වේදනාව, දුක සහ පාපයේ ගැටලුව යනු කුමක්දැයි පොත් දෙකක *(The Problem of Pain and A Grief Observed)* ලියූ පුද්ගලයෙකි. මෙම පොත් දෙකෙන්ම විදහා දැක්වන්නේ මෙවන් ආකාරයේ ගැඹුරු දේවල් පිළිබඳ අපගේ ආකල්ප,

අපගේ ලෝකදෘෂ්ටිය කෙරෙහි බලපාන බවය. ලෝකදෘෂ්ටිය යනු, වසර ගණනාවක් තිස්සේ ජීවිතය, මරණය සහ අපගේ පැවැත්මේ අර්ථය වැනි අමාරු ප්‍රශ්න කෙරෙහි බලපෑමක් ඇති කරන පිණිස අප එකිනෙකා ගෙන එන සිතුවිලි සහ අත්දැකීම් එකට කැටිකර ගත් රාමුවකි. අප මේ දේවල් ගැන වැඩිපුර කල්පනා නොකළද, අප හා හටත් එවැනි රාමුවක් ඇත.

*The Universe Next Door,* නම් අතිශයින් උපකාරයක් වන පොතේ, ඇත්තේ ලෝකදෘෂ්ටි තුනක් පමණක් බව ජේම්ස් සයර් අවධාරණය කරයි.[9] මුලින්ම, ආබ්‍රහම්ගෙන් ඇරඹි ආගම් තුන වන යුදෙව්, ක්‍රිස්තියානි සහ ඉස්ලාම් ආගම් දේවවාදී ලෝකදෘෂ්ටිය දරා සිටී. මෙහි විශ්වාසය වන්නේ දෙවි කෙනෙක් ලෝකය මවා එය පාලනය කරන බව සහ එම දෙවියන් විසින් මනුෂ්‍යා තම ස්වරූපයෙන් මවනු ලැබූ බවය. (මෙහිදී මා පැවසුවේ ලෝකදෘෂ්ටි “කාණ්ඩ” ගැන බව සැලකිල්ලට ගත යුතුය: මෙම කාණ්ඩ තුළ අතිශය වැදගත් වෙනස්කම් ඇති බව තම ශුද්ධ ග්‍රන්ථය ගම්භීරත්වයෙන් සලකන ඕනෑම යුදෙව්වෙකු, කිතුනුවෙකු මෙන්ම ඉස්ලාම් භක්තිකයෙකුද පිළිගනු ඇත).

දෙවනුව, ඊට ප්‍රතිවිරුද්ධ අදහස දරන අදේවවාදී ලෝකදෘෂ්ටිය ඇත. ඉන් කියවෙන්නේ මෙම විශ්වය (හෝ විශ්වයන්ට) අමතරව කිසිදු අධිස්වාභාවික පැතිකඩක් නැති බවය. තුන්වෙනුව, සර්වේශ්වරවාදී ලෝකදෘෂ්ටිය ඇත. එය දෙවියන් සහ ලෝකය යන සංකල්ප දෙක එකට එක් කර අපුද්ගලභාවයක් එනම් පුද්ගලභාවයෙන් තොර වූවක් බව උගන්වයි.

මීට අමතරව, ඒත්තු නොගන්නා (සැක සහිත) මෙන්ම දෙවියන් පිළිබඳ දැනගත නොහැකි යයි අදහස් දරන දෘෂ්ටිකෝණයන්ද ඇති බව මම හොඳාකාරයෙන් දනිමි. එනමුත් කිසිම කෙනෙක් සැම දේම සම්බන්ධයෙන් ඒත්තු නොගන්නා එනම් සැක කරන අය හෝ සැම දෙයක්ම දැනගත නොහැකි යයි සිතන අය හෝ වන්නේ නැත. මේ නිසා මනුෂ්‍යයාගේ ඇතුළාන්තයෙන් සියලුම දෙනා මෙහි දක්වන ලද ලෝකදෘෂ්ටින් තුනෙන් එකකට අයත් වෙයි.

මමද මෙම පින්තූරයට ගැළපෙන්නෙක් වෙමි. මටද ලෝකදෘෂ්ටියක් ඇත. මම කිතුනුවෙක් බැවින් කොරෝනාවයිරසය වැනි ස්වාභාවික ව්‍යසනයක් පිළිබඳ අන් කවර ස්ථානයක හෝ නොමැති අදහසක් කිතුනු චින්තනය තුළින් පැහැදිලි කර දෙන්නට මම උත්සාහ ගනිමි. සමහර විට ඔබ මා සමඟ එකඟ වන්නට පුළුවන, නැතහොත් එසේ නොවන්නට පුළුවන. එහෙත් ඔබ මේ පොත කියවා අවසන් කරද්දී, අවිනිශ්චිතභාවය කර පින්නාගත්, මරණය යථාර්ථයක් වූ ලොවක් තුළ, කිතුනුවන්ට බලාපොරොත්තුව ගැන විශ්වාසයෙන් යුතුව කථා කිරීමට හැකියාව ඇත්තේ මන්ද, ඔවුන්ට සියල්ල මධ්‍යයේ සමාදානය ඇත්තේ මන්ද යන කාරණා තේරුම් ගැනීමට හැකි වේය යන්න මගේ එකම පැතුමයි.

# 3. අදේවවාදය උපකාරයක් වේවිද?

ඔබගේ ලෝකදෘෂ්ටිය, ඔබ කොරෝනාවයිරස වසංගතය, භූමිකම්පා සහ සුනාමි වැනි ස්වාභාවික ව්‍යසනයන්ට මුහුණදෙන ආකාරය තීරණය කරන්නේය. නිදසුනක් ලෙස, දේවවාදීන් නවසීලන්තයේ භූමිකම්පාවට මුහුණදුන්නේ ගීතාවලිය 46 දැක්වෙන ආකාරයට දෙවියන්වහන්සේ කෙරෙහි ඇති තම ඇදහීම සාක්ෂාත් කරගනිමිනි:

> *"දෙවියන්වහන්සේ අපේ සරණ හා ශක්තිය වන සේක; හැමදා විපතේදී අපගේ පිළිසරණය. එබැවින් මහ පොළොව කම්පා වෙතත්, කඳු වැටි මහ මුහුදට කඩා වැටෙතත්, සත් සමුදුර ගුගුරා කැලඹෙතත්, එයින් නැඟෙන රැළ වේගයෙන් කඳු වැටි සැලෙතත් අපට කිසි විටක බියක් නැත" (1-3).*

වෙනත් දේවවාදීන් පවසා සිටියේ වසංගත, භූමිකම්පා සහ සුනාමි දෙවියන්ගේ ඍජු විනිශ්චය වන බවය: 2011 ජපානයේ සහ 2016දී නවසීලන්තයේ ඇති වූ භූමිකම්පාවලින් පසු විවිධ ආගම්වල මිනිස්සු බොහෝ දෙනා මේ ආකාරයේ දේ පැවසූහ. මේවා අතිශයින් පරුෂ ප්‍රතිචාර වූ අතර, ඉන් බොහෝ දෙනෙකුට ඒ නිසා අනවශ්‍ය ලෙස සිත් රිදීම් ඇති වන්නට ඇත.

ඒ අකාරයටම සර්වේශ්වරවාදීන් පැවසුවේ ඒවායින් වේදනාවට පත් වූවන් මීට ඉහත ආත්මවල කළ පාප නිසා එලෙස විඳවන්නට ඇති බවත්, මේ ආත්මයේදී ඔවුන් විඳි වේදනාවලට හේතුව වන්නේ ඔවුන්ගේ කර්මය එල දීමක් වන බවය.[10] ඒ අනුව මේ හේතුඵල දම්වැල කැඩීමට නොහැකි නිසා, ඔවුන්ගේ වේදනාව අඩු කිරීමට යමක් කිරීමේ තේරුමක් නැත; ඉන් සිදු වන්නේ ඔවුන්ගේ පවිත්‍රතාවයේ කාලය තවත් පමා වීම පමණක් වන බවය. මෙවැනි ලෝකදෘෂ්ටියකින් කොරෝනාවයිරසයෙන් හෝ වෙනත් ඕනෑම රෝගයකින් දුක් විඳින මිනිසුන්ට කිසිදු බලාපොරොත්තුවක් ලැබේ යයි සිතීමට අපහසුය. තත්වය තවත් සංකීර්ණ කරමින් සමහර පෙරදිග දාර්ශනිකයින් දුක දැක්කේ හුදෙක් මායාවක් වශයෙනි.

කෙනෙක් දරුණු රෝගයකින් පෙළෙනවා නම් හෝ යම් අනතුරකට භාජනය වී ඇත්නම් හෝ ඒ පුද්ගලයා රහසින් දරුණු පාප සිදු කර ඇති බව නිගමනය කිරීම, බයිබලයට අනුව වැරදි දෙයකි. බයිබලයේ ස්ථාවරය මෙය බව බොහෝ දෙනෙක් සිතාගෙන සිටිති. එනමුත් පැරණි ගිවිසුමේ යෝබ්ගේ පොත මෙම අදහසට ප්‍රතිවිරෝධය දක්වයි. යෝබ්ට පැමිණි දුක් සමුදායට ඔහු වගකිව යුතු යයි විශ්වාස කළ යෝබ්ගේ මිත්‍රයන්ට, ඔවුන් වැරදි යයි දෙවියන්වහන්සේම පවසන සේක.[11]

තවද, යෝබ්ගේ වේදනාව සහ දුක පැමිණියේ ස්වාභාවික සහ සදාචාරාත්මක නපුරේ එකතුවක් නිසාය. යෝබ්ගේ පවුලට විරුද්ධව දියත් කෙරුණු ප්‍රහාරවලට මුල් වූයේ සර්බියානු සහ කල්දි ජාතිකයින්ගේ මිනීමරු වැටලීම් දෙකක් (සදාචාරාත්මක නපුර) සහ ස්වාභාවික ව්‍යසන දෙකක් වූ ලැව් ගිනි සහ සුළි සුළං‍ය (ස්වාභාවික නපුර). (මා නැවත් වරක් අවධාරණය කරන්නේ මෙහි “නපුර” යන්නෙන් වේදනාවේ මූලාශ්‍රය තුළ දුෂ්ටකමක් ඇති බව නොහැඟවෙන බවයි - ගින්දරවල කිසිදු පාපිෂ්ඨකමක් නැත, එහෙත් එයින් සිදු වන හානිය නරක හෝ නපුරු දෙයක් ලෙස සඳහන් කළ හැකිය.)[12]

ඒ ආකාරයෙන්ම, දුක් විඳීම පෞද්ගලික වරද හා සම්බන්ධය යන අදහසට යේසුස් වහන්සේද විරුද්ධ වූ සේක.[13] නැවතත්, යෝබ් පොතේ සඳහන් පරිදි, ස්වාභාවික මෙන්ම සදාචාරාත්මක නපුර යන මාතෘකා දෙකටම සන්දර්භය බෙහෙවින් වැදගත්ය. යේසුස් වහන්සේ පිළිබඳ ඓතිහාසික චරිතාපදානයක් ලියූ ලූක් තුමා (ලූක්ගේ ශුභාරංචිය ලෙස හෝ ලූක් ලෙස අප හඳුන්වන) එක්තරා සිදුවීමක් මෙසේ විස්තර කරයි:

> “ඒ අවස්ථාවෙහි එහි සිටි සමහරෙක් කතා කොට, පිලාත් විසින් ගලීලයන් මරා ඔවුන්ගේ ලේ ඔවුන්ගේම යාග සමඟ මිශ්‍ර කළ අන්දම ගැන උන්වහන්සේට දැන්වූහ. උන්වහන්සේ ඔවුන්ට උත්තර දෙමින්, ‘ඒ ගලීලයන් එබඳු විපතක් වින්ද බැවින් ඔව්හු අන් හැමටම වඩා පාපී වූහ’යි ඔබ සිතන්නහුද? එසේ නොවේ යයි මම ඔබට කියමි. පසුතැවී සිත් හරවා නොගතහොත් ඔබ හැමද එසේම

විනාශ වන්නහුය. 'සිලෝවම්හි බලකොටුව වැටී ඊට යට වී මළ දසඅට දෙන ජෙරුසලමෙහි විසූ අන් හැමටම වඩා දුෂ්ට වූහ'යි ඔබ සිතන්නාහුද? එසේ නොවේ යයි ඔබට කියමි. පසුතැවී සිත් හරවා නොගතහොත් ඔබ හැමට වන්නේත් එම විපත්තියම යයි වදාළ සේක" (ලූක් 13.1-5).

රාජ්‍ය අනුග්‍රහයෙන් සිදු වූ කෲරකමක් (සදාචාරාත්මක නපුර) කෙරෙහි අවධානය ලබා දීමෙන් පසු උන්වහන්සේ ස්වාභාවික ව්‍යසනයකින් ජීවිතක්ෂයට පත් මිනිසුන් කණ්ඩායමක් වෙතට තම අවධානය යොමු කළ සේක. ඉන්පසු මෙම සිදුවීම් දෙකම අලළා උන්වහන්සේ මෙම සිදුවීම් දෙකේදීම ආපදාවට ගොදුරු වූවන් දෙවියන්වහන්සේ විසින් දඬුවමට පත් කරන ලද අතිශය සාහසික පව්කරුවන්ය යන ප්‍රසිද්ධ මතය හෙළා දුටු සේක. අප ජීවත් වන ලෝකයේ මෙවැනි දේ සිදුවන අතර, ඒවා තව දුරටත් සිදු වන්නට පුළුවන්කම ඇත. එසේම උන්වහන්සේ සර්වබලධාරී වූවත්, ඒවා සැම විටම දෙවියන්වහන්සේ සෘජුව සිදු කරන්නේ නැති බව මෙහි ව්‍යංගයාර්ථයයි.

එම අවස්ථාවේදී උන්වහන්සේගේ අවසාන වදන් පෙළ අපි කිසිසේත් අතපසු නොකළ යුතුය. එක්කෙනෙක් බේරී තවත් අයෙක් විනාශ වන විට එයින් ඔප්පු වන්නේ බේරුණු පුද්ගලයාගේ අනිවාර්ය නිර්දෝෂීභාවය නොවේය: "පසුතැවී සිත් හරවා නොගතහොත් ඔබ හැමට වන්නේත් එම විපත්තියමය" (පසුතැවීම ගැන පසුව සාකච්ඡා කරනු ලැබේ).

එලෙස පැවසුවද, 'සෑම ව්‍යසනයක්ම සහ රෝග යක්ම දෙවියන්වහන්සේගේ විනිශ්චය නොවේය' යනු පැහැදිලිවම ක්‍රිස්තියානි ඉගැන්වීම්වල කොටසක් වුවද (යෝබ්ගේ කථාව), සමහර අවස්ථාවල ඒවා දෙවියන්වහන්සේගේ විනිශ්චයන් වේ. කොරින්තියේ සභාවේ සමහරෙක් රෝගීව සිටින්නේ දෙවියන්වහන්සේගේ විනිශ්චය නිසා යයි මුල් කිතුනු සභාවේ නායකයෙක් වූ පාවුල් තුමා කොරින්තියේ සභාවට ලියා යවමින් ඔවුන් අතරේ වූ දුරාචාර ජීවන රටාව ගැන පසුතැවිලි වන මෙන් ඉල්ලා සිටියේය.[14] එනමුත්, පාවුල් තුමා මෙහිදී ඔවුන්ට ලියන්නේ දෙවියන්වහන්සේගේ ආත්මයාණන් වහන්සේගේ ආනුභාවයෙන් ලද විශේෂ ප්‍රඥාවෙන් යුතුවය. කවුරුන් හට මේ ආකාරයෙන් දඬුවම් දෙනවාද යන්න තීරණය කිරීමේ ආධිපත්‍යයක් අපට ඇත්තේ නැත. ස්වාභාවික නපුර නිසා ඇති වූ වේදනාව දිව්‍යමය දඬුවමක් ලෙස අර්ථ දක්වන අයගෙ න් පරෙස්සම් වන්න. එසේම, මෙම වසංගතය තුළින් දෙවියන්වහන්සේ කිසිවක් පවසන්නේ නැතැයි කියන අයගෙන්, විශේෂයෙන්ම දෙවියන්වහන්සේ සංස්කෘතියට ගැළපෙන්නේ නැතැයි පවසමින් උන්වහන්සේ බැහැර කළ බටහිර ලෝකයේ රටවල්වලට උන්වහන්සේ කථා කරන්නේ නැතැයි කියන අයගෙන් පරෙස්සම් වන්න

## අදේවවාදයට උපකාර කරන්නට නොහැකි හේතුව

සමහර අදේවවාදීන් යම් ආකාර "විනිශ්චයක්" සහ "ඉරණමක්" ගැන විශ්වාස කරන බව මෙහිදී නිරීක්ෂණය කළ යුතු කරුණකි - "කළ කම් එල දෙනවා" යන

කියමන පිටුපස ඇත්තේ මේ අදහසයි.

දේවවාදය ගැන කථා කරද්දී, විපත්තිවලට සහ ස්වාභාවික නපුර සඳහා ඇති එකම විසඳුම දෙවියන්වහන්සේ අතහැර දමා අදේවවාදියෙකු වීම යයි බොහෝ දෙනා කල්පනා කරති. කොරොනාවයිරස, පිළිකා, සුනාමි සහ භූචලනවලින් එකත් එකටම පෙන්නුම් කරන්නේ දෙවි කෙනෙක් නැති බව නොවේදැයි ඔවුහු අසති. මේ විශ්වය කර්කශ සහ හිත්පිත් නැති, අප ජීවත් වනවාද නැතිනම් මැරුණාද යන්න ගැන කිසිදු ආකාරයකින් සැලකිල්ලක් නොදක්වන එකක්ය යන කාරණයට අපි මුහුණදිය යුතු වෙමු.

මා වැනි කිතුනුවන් පොරබැදිය යුතු ප්‍රශ්න ගැන ස්කොට්ලන්ත ජාතික දාර්ශනිකයෙක් වූ ඩේවිඩ් හියුම් පෙන්වා දෙයි. ක්‍රි.පූ. තුන්වන ශතවර්ෂයේ විසූ ග්‍රීක දාර්ශනිකයෙකු ගැන සඳහන් කරමින් ඔහු මේ ප්‍රසිද්ධ ප්‍රකාශය කරයි:

*“එපිකියුරස්ගේ පැරණි ප්‍රශ්නවලට තවමත් පිළිතුරු ලැබී නැත. (දෙවියන්වහන්සේ) නපුර වළක්වාලීමට කැමැත්තෙන් සිටියද, එයට හැකියාවක් නැතිව සිටීද? එසේ නම් උන්වහන්සේ බෙලහීන අයෙක්ද? උන්වහන්සේට එයට හැකියාව ඇතත් එය සිදු කිරීමට අකැමැතිද? එසේ නම් උන්වහන්සේ දුෂ්ට අයෙකි. උන්වහන්සේට ඒ සඳහා හැකියාවක් හා කැමැත්තක් තිබේද?*[15]

එහෙත් නමුත් මෙම අදේවවාදී මාවත අවසන් වන්නේ කොතැනින්ද? දුක් විඳීමේ යථාර්ථයට රිචඩ් ඩෝකින්ස් දැක්වූ අදේවවාදී ප්‍රතික්‍රියාවට මෙය වෙනස් වන්නේ ඉතා සුළුවෙනි:

*"ස්වාභාවික ලෝකයේ වාර්ෂික දළ දුක් විඳීම ගැන කල්පනා කිරීමට පවා නොහැකිය. මට මෙම වාක්‍යය සකස් කිරීමට ගත වන මිනිත්තුව තුළ, දහස් ගණන් සතුන් පණ පිටින් කා දමනු ඇත, තවත් සතුන් පණ බයේ කෑගසමින් දිව යනු ඇත, තවත් සමහරෙකු පරපෝෂිතයින් විසින් ඇතුළතින් සෙමෙන් සෙමෙන් කා දමනු ලබමින් ඇත, දහස් ගණනක් කෑම බීම නොමැති වීමෙන් හෝ රෝගී වීම හේතුවෙන් මිය යති. එය එසේ සිදු විය යුතුය. යම් කිසි හේතුවකින් බහුලතාවයේ කාලයක් තිබුණද, එය නැවත ස්වාභාවික හාමතය සහ දුක්ඛිතකම ඇති වන තුරු ජනගහන වර්ධනයක් කරා යනු ඇත. ඉලෙක්ට්‍රෝන සහ ආත්මාර්ථකාමී ජාන, අන්ධ භෞතික බලවේග සහ ජාන ප්‍රතිගුණනයෙන් පිරි විශ්වයක සමහර මිනිසුන්ට වේදනා විඳීමට සිදුවන අතරම, තවත් අය වාසනාවන්ත වන්න යනවා. මේ දේවල්වලට කිසිදු රටාවක් හෝ හේතුවක් හෝ යුක්තිසහගත බවක් ඔබට සොයාගත නොහැකියි. අපට පෙනෙන මේ විශ්වය තුළ අවසානයේදී කිසිම සැලැස්මක්, කිසිම අර්ථයක්, කිසිම නපුරක්, කිසිම යහපතක් නැති අතර, එහි ඇත්තේ අන්ධකම සහ අනුකම්පා විරහිත උදාසීනභාවයක් පමණි.* DNA *මේ ගැන කිසිවක් දන්නේ හෝ සැලකිල්ලක් දක්වන්නේ හෝ*

*නැත. DNA හුදෙක් පවතී. අපි එහි සංගීතයට නැටවෙමු.”*[16]

මෙවන් දෙයකට කිතුනුවන් කුමන ආකාරයේ ප්‍රතිචාරයක් දැක්විය යුතුද? මුලින්ම කිව යුත්තේ ඩෝකින්ස්ගේ අදේවවාදයේ ස්වාභාවික වරණය සම්බන්ධ අනුවාදය, යහපත සහ නපුරේ සියලු ප්‍රභේදයන් නිෂ්ප්‍රභ කර ඒ වෙනුවට දෛවෝපගත විශ්වයක් තුළ අන්ධ, අනුකම්පා විරහිත උදාසීනභාවයක් පිහිටුවයි. කෙසේ වෙතත්, යහපත සහ නපුර ප්‍රතික්ෂේප කිරීමෙන් අදහස් වන්නේ (ඇත්තෙන්ම ඩෝකින්ස් මේ දෙය විශ්වාස කරනවා යයි සිතීම අපහසු වුවද) කොරෝනාවයිරසය නරක හෝ නපුරු දෙයක් ලෙස සැලකීමේ කිසිදු තේරුමක් නැති බවය.

එනමුත් ඔහු වැදගත් කරුණක් ඉදිරිපත් කරයි. ඒ කරුණ මත, අදේවවාදී විශ්වාස පද්ධතිය සැබවින්ම කොරෝනාවයිරසයට සාධාරණ ප්‍රතිචාරයක්දැයි අපට අසන්නට සිදුවේ. දෙවි කෙනෙක් නැත්නම් අප සැම තුළ ඇති යහපත සහ නපුර වැනි සංකල්ප පැමිණෙන්නේ කොතැනකින්ද? කොරෝනාවයිරසය සහ එහි අතුරු ප්‍රතිඵල කිසි ආකාරයකින් නපුරු යයි කීමට ඔවුන්ට බැරි හේතුව නම්, ඉන් ඇති වන මරණ ඇතුළු එහි ප්‍රතිඵල, හුදෙක් අංශු නැවත සකස් වීමක් වන බැවිනි.

ෆියඩෝර් ඩොස්ටොයව්ස්කි මෙසේ පවසා ඇත. “දෙවි කෙනෙක් නැත්නම්, ඕනෑම දෙයක් කිරීමට අවසර ඇත”.[17] මෙහිදී වැරදි වැටහීමක් ඇති නොවන පිණිස, අදේවවාදීන්ට සාදාචාරාත්මකව හැසිරීමට

නොහැකි යයි ඩොස්ටොයව්ස්කි පැවසුවේ නැති බව සඳහන් කළ යුතුය. ඇත්තෙන්ම අදේවවාදීන් තම සදාචාරාත්මක හැසිරීම්වලින් ආගමික මිනිසුන් ලජ්ජාවට පමුණුවා ඇති අවස්ථාද ඇත. සැම පිරිමියෙක් සහ ගැහැනියක්ම, දෙවියන් ඇදහුවත් නැතත්, සදාචාරයෙන් යුතුව දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් මවා ඇතැයි යනු කිතුනු දෘෂ්ටිකෝණයයි. එබැවින් ඕනෑම මනුෂ්‍යයෙක්ට සදාචාරාත්මකව හැසිරීමේ හැකියාව ඇත. අදේවවාදීන්ට සදාචාරාත්මක නිශ්චිතතාවයක් නැතැයි ඩොස්ටොයව්ස්කි පවසන්නේ නැත. ඒ වෙනුවට ඔහු ඊට වඩා ගැඹුරු දෙයක් පවසයි - දෙවි කෙනෙක් නැති කල යහපත සහ නපුර නමැති සංකල්ප සඳහා කිසිදු යුක්ති සහගත හේතුවක් නැත. රිචඩ් ඩෝකින්ස්ගේ ප්‍රකාශය මේ අදහස සම්පූර්ණයෙන්ම තහවුරු කරයි. අපගේ ප්‍රධාන මාතෘකාව ස්වාභාවික නපුර නිසා, මෙහිදී ඩෝකින්ස්ගේ මතයට අනුව, ත්‍රස්තවාදීන් සහ කාම්බෝජයේ මරණ මිටියාවත්වල සහ රුවන්ඩාවේ සිදු කෙරුණු ජන ඝාතනවල නියමුවන් තම ඇතුළාන්තයේ නිර්මාණය වී තිබුණු ජානමය ක්‍රියා පිළිවෙලට අනුව ක්‍රියාත්මක වන්නට ඇත. ස්ටාලින්, හිට්ලර් සහ මා ඕ වැන්නවුන්ද මානව සංහතියට එරෙහිව ඔවුන්ගේ භයංකර අපරාධ ක්‍රියාත්මක කළේද ඒ ආකාරයටමය. ඔබට සිතුණා නම් විනෝදය පිණිස පුංචි දරුවන් මරා දමන්නට, මේ මතයට අනුව එහිදී සිදුවන්නේ හුදෙක් ඩීඑන්ඒවල පදයට අනුව නැටීමක් නොවන්නේද? එය එසේ නම්. අප කිසි කෙනෙක්ට නපුරු වීමෙන් වැළකී සිටීමට ක්‍රමයක් නැත. එසේ නම් අපට ඇත්තේ එම තත්වයට කිසිදු විරෝධයකින් තොරව යටත් වීමටය.

සදාචාරයටද තේරුමක් නැත.

මට හිතෙන ආකාරයට, මෙම මතයට අනුව ජීවත් විය නොහැකිය. රිචඩ් ඩෝකින්ස්ම මේ සඳහා සාක්ෂියකි. ඔහුගේ තර්කය යහපත සහ නපුර වැනි දෙයක යථාර්ථය ගැන සැක පහළ කරයි: එහෙත් ඔහු 9/11 සහ එවන් අපරාධ නපුර ලෙස සලකන්නේ මන්ද?[18]

ඊළඟට සැලකිල්ලට ගත යුත්තේ, ස්වාභාවික හෝ සදාචාරාත්මක නපුර ගැන අප තුළ ඇති වන සාධාරණ කෝපය, අපෙන් පරිබාහිරව සහ ස්වාධීනව පවතින "යහපත" ගැන ප්‍රමිතියක් ඇති බවත්, අන් අයද අප සමඟ එවැනි දේ නුසුදුසු යයි එකඟ වනු ඇතැයි අපේක්ෂාවක් ඇති බවද පූර්වයෙන් උපකල්පනය කරයි. මෙවැනි ප්‍රමිතීන් ලෝකෝත්තරය - ඒවා පවතින්නේ මිනිස් මතයන්ට ඉහළිනි. නිදසුනක් ලෙස අප සැම දෙනාම, අපගේ ලෝකදෘෂ්ටිය කුමක් වුවද, කොරෝනාවයිරසය අයහපත් යයි පිළිගනිමු. එහෙත් දෙවි කෙනෙක් නැත්නම්, කිසිදු ලෝකෝත්තර වටිනාකමක්ද නැත්නම්, යහපත පිළිබඳ කිසියම් බාහිර ප්‍රමිතියක් තිබිය හැක්කේ කෙසේද? යහපතක් හෝ නපුරක් නැත්නම් සදාචාරය පිළිබඳ සංකල්පය එහෙම පිටින්ම බිඳවැටෙන අතර, සධාරණ කෝපයෙන් ඵලක් නැත. නපුර පිළිබඳ ප්‍රශ්නය - සදාචාරාත්මක හෝ ස්වාභාවික වේවා - අනුකම්පා විරහිත උදාසීනභාවයට දිය වී යයි.

රිචඩ් ටේලර් නමැති දාර්ශනිකයා ඊට එකඟතාවය පළ කරයි:

*"නූතන යුගය දිව්‍යමය ව්‍යවස්ථාදායකයා යන අදහස ප්‍රතික්ෂේප කළද, සදාචාරාත්මකව හරි සහ වැරදි අදහස් පවත්වාගෙන යාමට වෙර දරන්නේ දෙවියන් පැත්තකට දැමීමෙන් ඔවුන් සදාචාර සම්පන්න හරි සහ වැරදි දේ පිළිබඳ තේරුමක් ලබා දෙන කොන්දේසිද ප්‍රතික්ෂේප කර ඇති බව නොදැනය... මෙවැනි ප්‍රශ්නවලට ආගමෙන් තොරව කිසිම දිනක පිළිතුරු සොයගෙන නැති බව උගත් මිනිසුන්ට අමුතුවෙන් කිව යුතු නැත".*[19]

දහනව වන ශතවර්ශයේ දාර්ශනිකයෙක් වූ ෆ්‍රෙඩ්රික් නීට්ෂේ, බටහිර ශිෂ්ටාචාරයේ හදවත වූ බයිබලීය සදාචාරය අතහැර දැමීමේ ප්‍රතිඵල අන් කවරෙකුටවත් වඩා පැහැදිලිව දුටුවේය. දෙවියන්වහන්සේ නැසීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඩාවින්ගේ ක්‍රමයට අනුව "බලයට ඇති කැමැත්ත" - එනම් බලවන්තයන් දුර්වලයින් වනසා දැමීමේ තැනට සමාජය පිවිසෙන්නට යන බව ඔහු පැවසුවේය. ඔහු ඒ ගැන මෙසේ ලියා තැබුවේය:

*"බයිබලීය වාරණය වන "මිනී නොමරව" යන්න නිවට වැකි කඩකි... ජීවියාගේ සුවසම්පන්න සහ දිරාපත්වන කොටස් අතර "සම අයිතිවාසිකම්" ජීවිතය කිසිදු අවස්ථාවක පිළිගන්නේ නැත: එකක් අනෙක බැහැර කර කපා හැරිය යුතුය - නැත්නම් සමස්තයම විනාශ වනු ඇත".*[20]

නීට්ෂේ ක්‍රිස්තියානි සදාචාරය වහල්කමක් ලෙස සලකා එයට අවමන් කරමින් පෙන්වා දුන්නේ දෙවියන්ගේ මරණයත් සමඟ දයානුකම්පාවේ, කරුණාවන්තකමේ සහ සමාව දීමේ මරණයද සිදු වන බවය:

*"කෙනෙක් ක්‍රිස්තියානි විශ්වාසයන් අතහැර දැමූ කල එම තැනැත්තා ක්‍රිස්තියානි සදාචාරයට ඇති අයිතිවාසිකම්ද අතහැර දමන්නේය... ක්‍රිස්තියානි සදාචාරය වනාහි ආඥාවකි: එහි මූලාරම්භය ලෝකෝත්තරය... එය සත්‍යතාවයක් වන්නේ දෙවියන්වහන්සේ සත්‍යය නම් පමණකි - එය කඩා වැටෙන්නේ හෝ රඳා පවතින්නේ දෙවියන්වහන්සේ ගැන ඇති විශ්වාසය මතය."*[21]

තවත් පොතක නිට්ෂේ ප්‍රශ්න කරමින්, "ජීවිතය, ස්වභාවධර්මය සහ ඉතිහාසය යනාදිය සදාචාර සම්පන්න නැතිනම් සදාචාරයක් කුමටද?" යයි අසයි.[22] සෑම අදේවවාදියෙක්ම මේ ප්‍රශ්නය සමඟ පොරබැදිය යුතුය.

## ක්‍රිස්තියානියට තිබෙන ප්‍රශ්නය

කාරණාව නම් සදාචාරය පවතින්නකි. අප සදාචාරසම්පන්න ජීවීන් යයි අප දන්නේ ඍජු අත්දැකීම නිසාය. සම්භාව්‍ය ඔක්ස්ෆර්ඩ් ආචාරධර්මවේදියෙක් වූ ජේ.එල්. මැකී මෙසේ ලියා ඇත:

*"[ආචාරධර්මවල] කෙතරම් අමුතු ගුණාංග සහ*

*සබඳතා රැසක් ඇතුළත්ද කිවහොත්, ඒවා සියලු බලය ඇති දෙවි කෙනෙකුගේ නිර්මාණයෙන් හැර සාමාන්‍ය සිදුවීම්වලින් පැනනැගුණා යයි සිතිය නොහැකිය. එය එසේ නම්, නිසගයෙන්ම විධායක විෂයමූලික වටිනාකම් ඇත. ඒවා දෙවි කෙනෙකු නැතැයි අනුමාන කිරීමට වඩා දෙවි කෙනෙක් ඇතැයි අනුමාන කිරීමට ඉවහල් වෙයි. එබැවින් සදාචාරය තුළින් දෙවි කෙනෙකු ඉන්නවාය යන මතයට ආරක්ෂාකාරී තර්කයක් ගොඩනැගිය හැකිය."*[23]

මැකී එවන් ඒකාන්ත සදාචාරාත්මක ප්‍රමිතීන් ප්‍රතික්ෂේප කළ අදේවවාදියෙකි. එහෙත්, බිළිඳුන්ට වධ හිංසා කිරීම වැනි දේ වැරදි බව - සහමුලින්ම වැරදි බව - ඕනෑම කෙනෙක්ට නොපෙනී තියේවිද? අප අදේවවාදය වැලඳගෙන එහි තර්ක ඔස්සේ වාද කරන විට, එවැන් දේ වැරදි යයි ප්‍රකාශ කිරීමේ අයිතිය අපෙන් ගිලිහී යයි. දෙවියන්වහන්සේ සමීකරණයෙන් අයින් කළ පමණින් දුක සහ වේදනාව තුරන් වන්නේ නැත. ඒවාට අත නොගැසීම පමණක් සිදු වේ. එහෙත් දෙවියන්වහන්සේ අයින් කිරීමෙන් වෙනත් දෙයක් අයින් වන්නේය - එනම් පරම බලාපොරොත්තුවයි. මෙම කාරණය වෙතට අප පසුව යොමු වනවා. අප තවම ඩේවිඩ් හියුම් ඇසූ ප්‍රශ්නය සාකච්ඡා කළේ නැහැ: ප්‍රේමණීය දෙවි කෙනෙකු සිටිනවා නම් කොරෝනාවයිරසයක් තිබිය හැකිද?

# 4. ප්‍රේමණීය දෙවි කෙනෙකු සිටිනවා නම් කොරෝනාවයිරසයක් තිබිය හැකිද?

මෙම ප්‍රශ්නය සාකච්ඡා කිරීම පිණිස (ඉදිරි පරිච්ඡේද දෙක මේ සඳහා වෙන් කෙරෙනු ඇත) මුලින්ම අපි කරුණු තුනක් කෙරෙහි අවධානය යොමු කරමු: වයිරසවල සාමාන්‍ය ස්වභාවය; දෙවනුව, මනුෂ්‍යත්වයේ ස්වභාවය; සහ තුන්වෙනුව, කරුණු මෙලෙස සිදු වීම ගැන බයිබලය පවසන දේ.

## වයිරසවල සාමාන්‍ය ස්වභාවය

වයිරස ගැන සිතන පිණිස, ග්‍රිෆිත් සරසවියේ, ඔස්ට්‍රේලියානු රිවර්ස් ආයතනයේ සහකාර කථිකාචාර්ය පීටර් පොලාර්ඩ් විසින් ලෝක ආර්ථික සංසදයට ලියූ ලිපියකින් කොටස් කිහිපයක් මෙහි උපුටා දක්වමි:

> ‘වයිරසය’ යන වචනය බොහෝ මිනිසුන්ගේ හදවත්වල භීතිය ඇති කරලීමට සමත් වෙයි. ඒ තුළින් ඉන්ෆ්ලුවන්සාව, එච්අයිවී, කහ උණ, සහ ඉබෝලා වැනි රූප මැවී පෙනේ. ඇත්තෙන්ම මේ වැනි වයිරස ගැන අප බොහෝ සේ තැවෙනවා - ඒවා කරණකොටගෙන අප වෙත රෝග පමණක්

නොව දරාගත නොහැකි මරණද ගෙන එනවා."

"එහෙත් මිනිස් ශරීරය තුළට ඇතුළුව අති මහත් විනාශ ඇති කරන වයිරස වර්ග 21, පොළෝතලයේ ඇති මිලියන 100 පමණ වන වයිරස වර්ග අතරින් අතලොස්සක් පමණක් නියෝජනය කරයි. බොහොමයක් වයිරස අපගේ ජීවිතයේ පැවැත්මට අතිශයින් අත්‍යවශ්‍ය වෙයි."

"මෙවන් යහපත් වයිරසවල සංඛ්‍යාව පුදුම සහගතය. එලදායී විලක් හෝ ගංගාවක් තුළ ඒවායේ සාන්ද්‍රණය මිලි ලීටරයකට මිලියන 100ක් පමණ වෙයි - එය මුළු ඔස්ට්‍රේලියාවේ ජනගහනය මෙන් හතර ගුණයක් වතුර තේ හැඳි ¼ ක් තුළට දැමීම වැනිය... වයිරස සජීවී ජීවීන් කොටසක් නොවේ. ඒවා හුදෙක් ප්‍රෝටීනවලින් වැසී, පරපෝෂිතයන් සේ ක්‍රියා කරන ජාන කොටස්ය (DNA හෝ RNA වැනි). ඒවා ඔවුන්ගේ ඉලක්කගත සෛලයට (සත්කාරකයට) ඇතුළු වී, ඔවුන්ගේ ජානමය ද්‍රව්‍ය ඒ තුළට එන්නත් කර, එම සත්කාරක සෛලයේ පරිවෘත්තීය මාර්ගය උපයෝගී කරගෙන ප්‍රතිවර්තනය වන්නේය... එවිට එම සෛලයෙන් නව වයිරස සෛලයෙන් නික්මෙයි - එම සෛලය පිපිරී (ලයිසස්), (lyse), සිය ගණනාවක් වයිරස නිකුත් කරයි..."

"බැක්ටීරියාවල අධි වර්ධනය සහ වයිරස ආසාදනය යන ක්‍රියාවලීන් දෙක එකතු වී පරිසර පද්ධතීන් පවත්වාගෙන යයි. මේ අනුව, වයිරස අකාබනික පෝෂ්‍ය පදාර්ථ ප්‍රතිචක්‍රීකරණය සඳහා නැතුවම බැරි අංගයකි. ඒවා කුඩා මෙන්ම අවැදගත් ලෙස

පෙනුණත්, වයිරස ආහාර ජාල තුළින් පෝෂ්‍ය පදාර්ථ ප්‍රතිචක්‍රීකරණය කරමින් ගෝලීය වශයෙන් වැදගත් කාර්යභාරයක් ඉෂ්ට කරයි. අපගේ පැවැත්ම කෙරෙහි වයිරසවල ඇති ධනාත්මක වැදගත්කම අගය කොට සලකන්නට පටන් ගත්තේ මෑතක සිටය.”

“වයිරස අපගෙන් වැඩි සැලකිල්ලක් නොලත් කුඩාම වීරයන්ය.”[24]

එ අනුව, “වයිරසවලට මීට වඩා යහපත් පිළිගැනීමක් ලැබිය යුතුය” යන මැයෙන් ලිපියක් ලියමින් පෙන්සිල්වේනියා ප්‍රාන්ත විශ්වවිද්‍යාලයේ පාරිසරික වයිරස පිළිබඳ විද්‍යාඥ මෙරිලින් රූසින්ක් පවසන්නේ, වයිරස ජීවිතයට අත්‍යවශ්‍ය බවත්, වැඩිම වුණොත් 1% (අධි ඇස්තමේන්තුවක් කළහොත්) පමණ වයිරස ප්‍රමාණයක් පමණක් ව්‍යාධිජනක - එනම් සත්කාරක සෛලවලට හානිකර වන බවත්ය.

මේ අනුව වයිරස වැඩි වශයෙන් ප්‍රයෝජනවත් වන අතර, කෝවිඩ්-19 වැනි ඉතාම කුඩා ප්‍රතිශතයක් මිනිසුන්ට හානිකරය. කෝවිඩ්-19, සාමාන්‍ය සෙම්ප්‍රතිශ්‍යාව, ඉන්ෆ්ලුවන්සාව, නියුමෝනියාව වැනි ස්වශන රෝග කාරකවලට හේතු වන විශාල කොරෝනාවයිරස කාණ්ඩයකට අයත්ය.

මෙය භූ කම්පනවල තත්වයට සමානය. වොෂින්ටන් විශ්වවිද්‍යාලයට අනුබද්ධ භූ විද්‍යාඥ පීටර් වෝඩ් සහ තාරකා විද්‍යාඥ ඩොනල්ඩ් බ්‍රවුන්ලී විසින් රචිත,

Rare Earth නම් පොතේ එක පරිච්ඡේදයක් නම් කර තිබුණේ "The Surprising Importance of Plate Tectonics, (භූ ස්ථර චලනවල පුදුම සහගත වැදගත්කම) යනුවෙනි.[25] එහි තර්කය නම්, පෘථිවියේ භූමිකම්පා කාරක තැටි චලනය වීම නැවතුණහොත්, පෘථිවියේ ජීවින් රාශියක් නැසී වඳ වී යාම අවසානයේදී සිදු වනු ඇති බවයි. මෙයට හේතු කිහිපයක්ම ඇත. මහාද්වීප සෑදීම සහ භූතලය (කඳු) සහ මුහුදු අතර සමතුලිතභාවය පවත්වා ගැනීම සඳහා භූමිකම්පා කාරක තැටි චලනය වීම අතිශයින් වැදගත්ය. එමෙන්ම එය ඒකාකාර කාබන්ඩයොක්සයිඩ මට්ටමක් පවත්වාගෙන යාම සඳහා රසායන ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයද සිදු කරමින් ගෝලීය උෂ්ණත්වමාපකයක් ලෙසද ක්‍රියා කරයි. තවද, භූමිකම්පා කාරක තැටි චලනය තුළින්, ජීවීන්ට මරණය කැඳවන අන්තරීක්ෂ කිරණවලින් පෘථිවිය ආරක්ෂා කර, එහි චුම්භක ක්ෂේත්‍රය ස්ථිරව පවත්වාගෙන යාමටද උපකාරී වන බවට වෝඩ් සහ බ්‍රවුන්ලි තර්ක කරති. ඔවුන්ගේ නිගමනය නම්, "භූමිකම්පා කාරක තැටි චලනය, ග්‍රහයක ජීවිතය සඳහා ප්‍රධානම අවශ්‍යතාවය විය හැකි අතර, ලෝකයකට නොකඩවා ජලය සැපයීම සඳහා එය අත්‍යවශ්‍ය" වන බවය.

වයිරස මෙන්ම භූ කම්පනද, ජීවිතයට අත්‍යවශ්‍ය බව පෙනී යයි. මැවුම්කාර දෙවි කෙනෙක් සිටී නම්, එතුමා මේ සියල්ලේ පැවැත්ම ගැන වගකිව යුතුය. එහෙත් මේ දේවල් තිබිය යුත්තේ ඇයි? කොරෝනාවයිරස වසංගතය වනාහි ජීව විද්‍යාව එහි කාර්යභාරය ඉටු කිරීම යයි - සමහරුන් කියන ආකාරයට- පැවසීම පමණක් ප්‍රමාණවත් වන්නේ නැහැ නේද? ඊට වඩා

යමක් මෙහි තිබිය යුතුයි නේද?

වයිරස වැඩි සංඛ්‍යාවක් ප්‍රයෝජනවත් බව සහ සමහර ඒවා ජීවිතයට නැතුවම බැරි බවත් විද්‍යාව අපට පෙන්නුම් කරයි. එහෙත් මහත් විපත් ඇති කරන රෝගකාරක වයිරසවල අවශ්‍යතාවය කුමක්ද? දේවවාදීන්ට වැදගත් ප්‍රශ්නය වන්නේ මෙයයි. එනම්: දෙවියන්වහන්සේ මැව්වේ වයිරස රෝගකාරක නැති ලෝකයක් නොවේද?

මෙය සමාකාර ප්‍රශ්න රාශියකට අප රැගෙන යයි. අනතුරුදායක නොවන විදුලිය හෝ පිච්චෙන්නේ නැති ගින්දර මවන්නට දෙවියන්වහන්සේට බැරි වුණාද? විලෝපනය නැති ඓන්ද්‍රිය ලෝකයක් මවන්නට දෙවියන්වහන්සේට බැරි වුණාද? කිසි වරදක් නැති සහ ප්‍රයෝජනවත් වයිරස් පමණක් ඇති ලෝකයක් මවන්නට දෙවියන්වහන්සේට බැරි වුණාද? කිසි වරදක් නොකරන ජීවීන් මවන්නට දෙවියන්වහන්සේට බැරි වුණාද? (කොරෝනාවයිරස කෙතරම් භයානක වුවද, ඊට වඩා වැඩි සංඛ්‍යාවක් මේ වසර තුළ මිනිසා විසින් මිනිස් ඝාතන සිදු කරන බව අපි දනිමු.)

## මනුෂ්‍යත්වයේ ස්වභාවය

මේ ප්‍රශ්න අතරෙන් අන්තිම ප්‍රශ්නයට යම්තාක් දුරට පිළිතුරක් සැපයිය හැකිය. ඊට පිළිතුර පැහැදිලිවම “ඔව්, පුළුවන් වුණා” යන්නයි. ඇත්තෙන්ම දෙවියන්වහන්සේ කිසිම සදාචාරාත්මක වරදක් නොකරන දේ මැවූ සේක. සතුන් සදාචාරාත්මක ජීවීන් නොවේ. සිංහයෙකු විසින්

සත්වෝද්‍යාන රැකවලා මරා දමනු ලැබුවේ නම් සිංහයා මිනී මැරුමක වූදිතයෙකු වන්නේ නැත. ඌ සදාචාරය නොදන්නා ජීවියෙකි.

අභ්‍යන්තර වැඩසටහන් ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන රොබෝවරුන්ගේ ලෝකයක් දෙවියන්වහන්සේට සාදන්නට පුළුවන්කම තිබුණි. එහෙත් එම ලෝකය තුළ අප මිනිසුන් ලෙස අන්තර්ගත නොවනු ඇත. ඇත්ත වශයෙන්ම, නපුර කිරීමේ ප්‍රවණතාවයක් නැති ලෝකයක වාසය කිරීමට පතන අය සැබවින්ම පැවැත්මෙන් ඉවත් වීමට කැමැත්තෙන් සිටිති. හේතුව, දෙවියන්වහන්සේ අපට දී ඇති ශ්‍රේෂ්ඨතම ත්‍යාගවලින් එකක් වන්නේ නිදහස් කැමැත්ත එනම් ස්වාධීන තෝරා ගැනීමයි. අපට "කැමතියි" හෝ "අකැමැතියි" යනුවෙන් පැවසීමේ හැකියාව ඇති නිසා එම හැකියාව ආශ්චර්යමත් දේවලට අප නිරාවරණය වේ: ප්‍රේමය, විශ්වාසය සහ දෙවියන්වහන්සේ සහ එකිනෙකා සමඟ නිර්ව්‍යාජ සම්බන්ධකම් පැවැත්වීම ඉන් සමහරකි. එනමුත්, එම විස්මිත සහ යහපත් ධාරිතාවම අපට නපුර කිරීමට අවසර නොදුන්නද එය කිරීමේ ප්‍රවණතාවය ලබා දෙයි.

මෙය දේවධර්මධරයන් විසින් දෙවියන්වහන්සේගේ ඉඩහරිනලදද කැමැත්ත ලෙස දක්වනු ලැබේ - නපුර සිදුවිය හැකි විශ්වයක් දෙවියන්වහන්සේ මැවූ බව සහ දෙවියන්වහන්සේගේ නියෝගකරනලදද කැමැත්ත - දෙවියන්වහන්සේ සක්‍රීයව කරන දේවල් ලෙස වෙන් කොට හඳුනාගෙන ඇති ඉතාම සුවිශේෂී කරුණකි. දෙවියන්වහන්සේ නපුරේ කර්තෘවරයාණන් නොවන බව නව ගිවිසුම ඉතාම පැහැදිලි ලෙස පෙන්වා දී ඇත.

උන්වහන්සේ මැවූ ලෝකය තුළ නපුර තිබීමට පුළුවන් වුවද, ලෝකය උදේසා එය එතුමන්ගේ අභිලාෂය නොවේය.[26]

මනුෂ්‍යයන්ට දේවල් වරද්දා ගැනීමට පවා එක්තරා ප්‍රමාණයක නිදහසක් ඇති බව මෙයින් අදහස් කෙරේ. අප ජීවත් වන්නේ නිර්ණායන විශ්වයක එනම් මානව ක්‍රියාවන් ඇතුළුව සියලු සිදුවීම් අවසාන වශයෙන් තීරණය වන්නේ කැමැත්තට බාහිර යැයි සැලකෙන හේතු මතය යැයි රිචඩ් ඩෝකින්ස් මෙන්ම, අභාවප්‍රාප්ත විද්‍යාඥ ස්ටීවන් හෝකින්ද සිතුහ. එය එසේ නොවේය.[27] දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට තෝරා ගැනීමේ නිදහස ලබා දී, තමන් වහන්සේම සර්වබලධාරීව සිටින සේක. බයිබලය මේ කරුණු දෙකම පැහැදිලිව විදහා දක්වයි. මෙය ක්‍රියාත්මක වන ආකාරය ගැන කිතුනුවන් අතර විවිධ මතවාද ඇත. ඒ ගැන කථා කිරීම සඳහා අවස්ථාව මෙය නොවේ. මෙහිදී අපගේ අරමුණ වන්නේ කොරෝනාවයිරසය නිසා දෙවියන්වහන්සේ මහත් සේ පුදුමයට පත්ව නැති බව පෙන්නුම් කිරීමය: ඒ නිසා සිදු වන නපුර තුළ වුවද, උන්වහන්සේට යහපත පිණිස ක්‍රියා කළ හැකිය. උන්වහන්සේගේ සැලසුම් නිෂ්ප්‍රභ වී නැතත්, මේ අදහස් මෙවැනි වෙලාවක පිළිගැනීම තරමක අසීරු කරුණක් ලෙස පෙනී යනු ඇත. ඒ සමඟම මෙම අර්බුදකාරී අවස්ථාවේදී අප දක්වන ප්‍රතිචාර ගැන මෙන්ම එකිනෙකා ගැනත් අපට වගකීමක් ඇත්තේ ඒ සඳහා දෙවියන්වහන්සේ අපට නිදහසක් දී ඇති බැවිනි. අප ජීවත් වන්නේ සමහර විට සියලු දේම වරදින ලෝකයක සේම මිනිසාට වැරදි දේ (නැතහොත් හරි දේ) කිරීමට තෝරා ගැනීමේ නිදහස

ඇති ලෝකයකයි. ලෝකය ඒ ආකාරයෙන් පවතින්නේ ඇයි? එම ප්‍රශ්නයට බයිබලයේ පිළිතුර මෙන්න.

## කරුණු මෙලෙස සිදු වීම ගැන බයිබලය පවසන දේ.

එය මේ ආකාරයෙන් සිතන්න. දෙවියන්වහන්සේ තමාගේ "යහපත්" මැවීම තුළ ජීවත් වන පිණිස මිනිසා තෝරා ගත් අවස්ථාවේ, ඔවුන්ට තෝරා ගැනීමේ නිදහස දායාද කොට දීම නිසා ඔවුහු සදාචාරාත්මක ජීවීන් බවට පත් වූහ. එම නිදහස අවභාවිත කිරීම කරණකොටගෙන, සදාචාරාත්මක බිඳවැටීමක් සිදු වීමේ ප්‍රවණතාවයද තිබුණි. බයිබලයේ මුල් පොත වන උප්පත්ති පොතේ තුන්වන පරිච්ඡේදයේ විචිත්‍රවත් ලෙස විස්තර කර ඇති ලෙස සිදු වූයේද ඒ දෙයමය.

උත්පත්ති පොතේ තුන්වන පරිච්ඡේදයේ දක්වන්නේ, මිනිසාගේ අකීකරුකම පැනනැගුණේ ජීවිතයේ ස්වභාවය සහ මරණයට ඇති බරපතල හැකියාව පිළිබඳව දෙවියන්වහන්සේ සමඟ ඇති වූ මූලික එකඟ නොවීම නිසා බවයි. දෙවියන්වහන්සේ විසින් මුල් මිනිස් යුවළ වූ ආදම් සහ ඒවට, උන්වහන්සේ තහනම් කර තිබූ හොඳ-නරක අවබෝධ කිරීමේ ගසින් කෑවොත් - නොඑසේ නම් ඔවුන් උන්වහන්සේගේ අණ නොතකා ක්‍රියා කළහොත් හෝ උන්වහන්සේගෙන් ස්වාධීනව ක්‍රියා කළහොත් - ඒ දවසෙහි මරණය ඒකාන්ත යයි අනතුරු ඇඟවීමක් කරනු ලැබ තිබුණි (උත්. 2.17). මෙම පලතුරු ගස කුමක්ද නැතහොත් එය ආහාරයට ගැනීමෙන් යහපත සහ නපුර දැනගැනීමට ලැබෙන පිණිස එහි මොන ආකාරයේ සංඝටක තිබෙන්නට

ඇත්ද යන්න සාකච්ඡා කිරීම මෙහිදී අනවශ්‍යය. ඒ ආකාරයෙන් අර්ථ විග්‍රහ කිරීමෙන් මෙහි ඇති වැදගත් කාරණය වරද්දා නොගනිමු. ඕනෑම ගසකින් කෑමේදී - එපමණක් නොව, ඕනෑම දෙයක් කුමන හෝ චේතනාවකින් කිරීමේදී - අපගේ මැවුම්කරුවාණන් වහන්සේගේ හෝ පාලකයාණන් වහන්සේගේ කැමැත්තට හෝ වචනයට එපිටින් යාම නොපනත් ක්‍රියාවක්ය. ජීවියාගේ කැමැත්ත මැවුම්කරුවාණන් වහන්සේගේ කැමැත්ත අබිබවා යාමේ මානසිකත්වය, මැවුම්කරුවාණන් වහන්සේ පසෙකට තල්ලු කර දමා, තමාගේම ආත්මාර්ථකාමී අභිලාෂයන් සහ ජීවිත අර්ථ විග්‍රහයන් මුදුන්පමුණුවා ගැනීමට වෙර දරන්නකි. පාපය ලෙස හැඳින්වෙන්නේ මෙයයි. දෙවියන්වහන්සේ ඒ මිනිසුන්ට අනතුරු ඇඟවූ ආකාරයට, එම පාපය මගින් මරණයට මඟ පාදන ලදී. භෞතික වින්දනයේ හෝ සෞන්දර්යාත්මක සන්තුෂ්ටියේ මෙන්ම සදාචාරාත්මක දැනුම හෝ බුද්ධිය ලබා ගැනීමේ කිසිදු නෛසර්ගික වරදක් නැත. එහෙත් මේ දේවල් ජීවිතයේ එකම හරය යයි සිතීම - නැතහොත් දෙවියන්වහන්සේගෙන් තොරව ජීවිතය භුක්ති විඳිමින්, උන්වහන්සේගේ වචනයට එරෙහිව හෝ වචනය නොසලකා හැරීමෙන් ඒවායින් වින්දනයක් ලබා ගත හැකි යයි කල්පනා කිරීම මූලික සහ දුක්ඛිත රැවටීමකි. දෙවියන්වහන්සේ අපි භුක්ති විඳින සියලු ආකාර යහපත් දේවල ප්‍රභවය වනවා පමණක් නොව; අපට දායාද කරන අන් සැම යහපතකම පරම අර්ථය සහ වැදගත්කම ගෙන දෙන උත්තරීතර යහපත වන්නේද උන්වහන්සේය.

උත්පත්ති 3 වන පරිච්ඡේදයේ සිදු වූයේ මිනිසුන්

දෙවියන්වහන්සේ ප්‍රතික්ෂේප කිරීම නිසා පාපය ලොවට ඇතුළු වීමය. එහි ප්‍රතිඵලය අති මහත්ය. මරණය - මුලින්ම ආත්මික ලෙස මිනිසා සහ දෙවියන්වහන්සේ අතර වූ සම්බන්ධකම දුරස්ථ වී පසුව ශාරීරික මරණය සිදු විය. එම සිදුවීම තුළින්ම ස්වභාවධර්මයද ඉරිතලා ගියේය. මේ කාරණය අපගේ ප්‍රධාන තේමාව වෙතට අප රැගෙන යයි. උත්පත්ති පොතට අනුව, මිනිසාගේ කැරලිගැසීමෙන් පසුවත්, ඔවුන්ට දේව අභිමුඛයෙන් ඉවත් වීමට සිදු වුවද, පොළොව බලාගැනීමේ කාර්යභාරයෙන් ඔවුන් එකවරටම පහ කළේ නැත. පොළොවේ විභවය වර්ධනය කිරීමේ කාර්යයේ දිගටම නියැලී සිටිමට ඔවුන්ට අවකාශ තිබුණි. ඒ සමඟම, කෙසේ වෙතත්, මැවීම නිෂ්ඵලභාවයට යටත් කරන ලද්දේ, ඒකේම කැමැත්තෙන් නොව... එසේ යටත් කළ උන්වහන්සේගේම කැමැත්තෙනි (රෝම 8:20).[28]

ග්‍රීක් භාෂාවේ "නිෂ්ඵලභාවයට" *(mataiotēs)* යන වචනයෙන් යමක් "නිරපරාදේ" සිදුව ඇති බවක් ඇඟවේ: එනම් එය නිර්මාණය කර ඇති ඉලක්කය සපුරා නැත. මෙම කොටසේ මැවීම, නිෂ්ඵලභාවයට සහ අකාර්යක්ෂමතාවයට භාජනය වූයේ "එහිම කැමැත්තෙන් නොව" යයි පවසන විට එයින් අදහස් කරන්නේ, ආදම් නිසා දෙවියන් වහන්සේ භූමිය පිටට ශාපය පැමිණෙවූ බවයි:

*"නුඹේ මේ ක්‍රියාව නිසා පොළොවට ශාප වේවා! දිවි ඇති තාක් නුඹ වෙහෙස මහන්සි වී එයින් ආහාර ලබාගන්නෙහිය; පොළොව නුඹට කටු පඳුරුද, වල් පැළෑටිද උපදවන්නේය. නුඹ වනයේ පලා*

*කන්නෙහිය" (උත්. 3.17-18).*

එයින් අදහස් කරන්නේ, දෙවියන්වහන්සේ හා මිනිසුන් අතර වූ සම්බන්ධය දෙදරා යාමේ ප්‍රතිවිපාක මිනිස් වර්ගයා කෙරෙහි වඩා පුළුල් ක්ෂේත්‍රයකට බලපාන්නට යන බවයි. තොටියා නිවැරදි දිශාවට ඔරුව නොපැදවීම නිසා ඔහු පමණක් නොව, ඔරුවේ සිටින සියල්ලෝම අනතුරට පත් වෙති - ඔරුවද අනතුරට භාජනය වෙයි. එලෙසින්ම, මිනිසාට නියම කරන ස්ථානයේ - එනම් දෙවියන්වහන්සේ විසින් උන්වහන්සේ දැනගන්නා පිණිස සහ මැවුම්කරුවාණන් වහන්සේගේ නීතිවලට අනුව මැවීම භුක්ති විඳින පිණිස නිර්මාණය කරන ලද ස්ථානයේ - රැඳී සිටීම ප්‍රතික්ෂේප කිරීම තුළින්, දෙවියන්වහන්සේගේ යහපත් මැවීම පලුදු වී ඉරිතලා ගොස් ඇත. පසුගිය ශතවර්ෂ පුරාවටම පෘථිවිය සහ එහි සම්පත්වල වර්ධනය වෙනුවෙන් ඉදිරියට තැබූ අතිවිශිෂ්ට පියවර අපි කිසිසේත් ප්‍රශ්න නොකරමු. ඒ කිසිදු සාර්ථකත්වයක් සම්පූර්ණ නොවීය: වරක් සමෘද්ධිමත්ව තිබුණු, එහෙත් පසුගිය ශතවර්ෂවලදී අභාවයට ගිය ශිෂ්ටාචාර මීට සාක්ෂි දෙයි. ස්වභාවධර්මය නැවත නැවතත් කැඩී බිඳී ගොස් කටු පඳුරු හා වල් පැළෑටි, දුෂ්කර ලෙස ශ්‍රමය ලබා දීම, පළිබෝධ, ලෙඩ රෝග, වසංගත, ඉඩෝර, සාගත, භූමිකම්පා, ගිනිකඳු ආදිය මගින් මිනිසාගේ ප්‍රගතියට අකුල් හෙළා ඇත. මීට අමතරව, ආත්මාර්ථකාමී බව, තණ්හාව සහ සදාචාරාත්මක පිරිහීමේ විනාශකාරී බලපෑම්ද කනගාටුදායක අන්දමින් මෙයට එකතු කළ යුතුව ඇත.

## යහපත සහ නපුර වෙන් කරන රේඛාව

අපගෙන් කිසිම කෙනක්ට ලෝකයේ නපුර සහ වේදනාව, අපේ ජීවිතවලට කිසිසේත් බලපාන්නේ නැති ප්‍රශ්නයක් ලෙස සාකච්ඡා කළ නොහැකිය. ස්ටාලින්ගේ ගුලාග් කඳවුරුවලින් බේරීමට සමත් වූ, රුසියානු ගත් කතුවරයෙක් වන ඇලෙක්සැන්ඩර් සෝල්ජනෙට්සින් මෙසේ ලියා ඇත:

> *"සියල්ල එතරම්ම සරල වූවා නම්, නපුරු ක්‍රියාවල යෙදෙන සියල්ලෝම එක්තරා ස්ථානයක සිටියදී ඔවුන් අන් අයගෙන් වෙන් කර විනාශ කර දැමීමට පුළුවන් කම තිබුණා නම් කෙතරම් හොඳද! එහෙත් යහපත සහ නපුර වෙන් කෙරෙන රේඛාව වැටී ඇත්තේ සැම මනුෂ්‍යයෙකුගේම හදවත හරහාය. තමාගේම හදවතෙන් කොටසක් විනාශ කර දැමීමට කැමති වන්නේ කවුරුන්ද? ඕනෑම හදවතක ආයු කාලය තුළදී මෙම රේඛාවේ ගමන්මග වරින් වර වෙනස් වෙයි. සමහර අවස්ථාවලදී එය පැත්තකට තල්ලු වී වැඩි ඉඩක් නපුර විසින් ලබාගන්නා අතර, තවත් වරෙක එය යහපතට වැඩිපුර ඉඩක් සලසා දෙයි. එකම මිනිසා, විවිධ වකවානුවලදී, විවිධ තත්වයන් යටතේ, සම්පූර්ණයෙන්ම වෙනස් ස්වභාවයන් පෙන්නුම් කළ හැකිය... එහෙත් එම මිනිසාගේ නම වෙනස් වන්නේ නැති බැවින්, එම නාමයට අපි යහපත සහ නපුර වශයෙන් බොහෝ දේවල් ආදේශ කරමු.*[29]

අප ඉවෙන් මෙන් දැන සිටි දේ සෝල්ජනෙට්සින් ප්‍රසිද්ධයේ ප්‍රකාශ කිරීමට ඉදිරිපත් විය: මැවීම තුළ සහ සමස්තයක් ලෙස සහ මිනිස් සංහතිය තුළද යහපත සහ නපුර ඇතුවාක් මෙන්ම, අප එක් එක්කෙනා තුළද යහපත සහ නපුර යන දෙකම පවතී. අපිද ප්‍රශ්නයේ හවුල්කරුවෝ වෙමුව. අදේවවාදී දාර්ශනිකයෙක් වූ ජෝන් ග්‍රේ මෙම අදහසට නොසිතූ විධියේ සහයෝග යක් ලබා දෙයි:

*"වැදගත්ම අවශ්‍යතාවය නම්, මිනිසා ප්‍රචණ්ඩත්වයේ සහ පීඩිතභාවයේ ඉතිහාසයකට උරදෙන, සහජයෙන්ම යහපත් ජීවීන්ය යන මතය වෙනස් කිරීමයි. මෙහිදී අපි දැනට පවත්නා මතය පිළිබඳ යථාර්ථය සහ එහි ප්‍රධානම අවහිරය වෙත එළඹෙන්නෙමු: එනම් මනුෂ්‍යා තුළ සහජයෙන් පිහිටා ඇති අඩුපාඩු."*

*"සෑම පූර්ව නූතන චින්තකයෙකුම පාහේ මනුෂ්‍ය ස්වභාවය ස්ථාවර සහ දෝෂ සහිත ලෙස අනිවාර්යෙන්ම විශ්වාස කළ හෙයින් මේ කාරණය පිළිබඳ මෙන්ම තවත් එවැනි කාරණා කිහිපයක් සම්බන්ධයෙන් ඔවුහු සත්‍යයට සමීපව සිටියහ. මිනිස් ආවේග ස්වාභාවිකවම අවංකය, සාමකාමීය හෝ සාධාරණය යනුවෙන් උපකල්පනය කරන කිසිදු දේශපාලනික මතයක් විශ්වාස කළ නොහැකිය."*[30]

මෙහිදී අදේවවාදියෙකු, මිනිසා දෙවියන්වහන්සේට එරෙහිව කැරලිගැසීමේ ආදීනව ගැන උත්පත්ති

ඉගැන්වීම - පාපයේ යථාර්ථය - සනාථ කරනු පෙනේ.[31] අප දෝෂ සහගතය යන දත්තය තේරුම්ගත් කල සදාචාරාත්මක නපුර පිළිබඳ වඩාත් යථාර්ථවාදී පෙළගැසීම මේ ආකාරයෙන් විය හැකිය: "මම නපුර කරමි. එසේම නපුරු කල්පනාවල නිරත වෙමි. එසේනම්, දෙවි කෙනෙක් ඇත, ඒ දෙවියන් තවමත් මා ගැන ඉවසන්නේ මන්ද?"

## වෙනත් ප්‍රශ්නයක්

මිනිස් ස්වභාවයේ මෙන්ම භෞතික ස්වභාවයේද ගැඹුරු දෝෂ ඇති බව සැබවින්ම පැහැදිලිය. ලෝකය සාහසික සහ දුරාචාර මිනිස් හැසිරීම්වලින් මෙන්ම භූමිකම්පා, සුනාමි, පිළිකා සහ කොරෝනාවයිරස වසංගතවලින්ද පිරී පවතී.

දැන් යහපත්, ප්‍රේමණීය සහ සියලු බලය ඇති දෙවි කෙනෙක් කළ යුත්තේ, කළ හැක්කේ සහ කරන්නට ඇත්තේ කුමක්දැයි අපට දිගටම තර්ක කළ හැකිය. එවන් සාකච්ඡාවකින් අප කිසි කෙනෙක් සෑහීමකට පත් නොවන බව අත්දැකීමෙන් අපට පෙනී ගොස් ඇත.

ඊට හේතුව නම් - අපි මොන දේ පැවසුවත් - අප සැමදාම සිටියේ මෙතැනය, ලෝකය කවදත් පැවතුණේ මෙයාකාරයෙනි. නටබුන් වූ ආසන දෙව්මැදුරේ චිත්‍රය මෙන්ම, හිරු එළියෙන් විකසිත වන කුසුමේ සුන්දරත්වයද, මිනිස් ශ්වසන පද්ධතිය විනාශ කරන කොරෝනාවයිරසයේ ඇති අවලක්ෂණ ස්වභාවයද එකවර මිශ්‍ර කර අප ඉදිරියේ විදහා දැක්වෙනු ඇත.

ගණිතඥයෙකු ලෙස, සමහර විට අවුරුදු ගණනාවක් පුරාවට, අප එකම ගැටලුවක් නිරාකරණය කිරීමට උත්සාහ කර අසමර්ථ වූ තැන, වෙනත් ගැටලුවක් වෙත යොමු වීම මීට වඩා ඵලදායක නොවන්නේද කියා සිතන ආකාරය ගැන මම හොඳින් දනිමි.

අපට ඇසිය හැකි තවත් ප්‍රශ්නයක් ඇත. එනම් අප පිළිගන්නා ආකාරයට - අප ජීවත් වන්නේ ජෛව සුන්දරත්වයෙන් සේම මාරක රෝග කාරකයන්ගෙන්ද ගහන විශ්වයක යයි අපි පිළිගනිමු නම් - මේ සියල්ල පිළිබඳත්, අපගේ ජිවිත සහ අනාගතය පිළිබඳත් විශ්වාසය තැබිය හැකි දෙවි කෙනෙක් සිටින බවට සාධක තිබේද?

# 5. ප්‍රේමය පිළිබඳ සාක්ෂි

අප දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීමට නම්, උන්වහන්සේගේ යහපත්කම ගැන ප්‍රබල සාක්ෂි තිබිය යුතුය. එම නිසා මේ අවස්ථාවේදී ක්‍රිස්තියානි ධර්මයේ අරටුව බඳු ඉගැන්වීම්වලට ඔබ සවන්දිය යුතුය. සමහර විට ඒවා ඔබට අලුත් විය හැකිය. නැතහොත් හුරුපුරුදු ඉගැන්වීම් විය හැකිය. කොරෝනාවයිරසය හෝ වෙනත් වසංගතයක්, රෝග යක් හෝ ස්වාභාවික ලෝකයේ කඩා වැටීමක් තිබීම යන කාරණා, දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීම හා ගැළපෙන්නනේ නැතැයි නිගමනය කිරීමට පෙර ඔබ මේ ටික තේරුම් ගැනීමට උත්සහා ගත්තා නම් යහපත් වනු ඇත.

දෙවියන්වහන්සේ යේසුස් ක්‍රිස්තුස් නම් මිනිසා ලෙස ශරීරාකාරයෙන් ලොවට පැමිණි බව - මැවුම්කරුවාණන් වහන්සේම මැවීම බවට පත් වූ බව - ක්‍රිස්තියානි ධර්මය අවධාරණය කරයි. එම යේසුස් ක්‍රිස්තුස් යෙරුසලමෙන් මඳක් ඔබ්බෙන් පිහිටි ස්ථානයක කුරුසියක් මත මරණයට පත් වූ බව ක්‍රිස්තියානි ධර්මයේ හදවත වැනි වූ පණිවිඩයයි. එතුමා ශරීරාකාරයෙන් ලොවට පැමිණි දෙවියන්වහන්සේ නම්, එතුමා කුරුසියක් මත කුමක් කළේදැයි එක වරටම ප්‍රශ්නයක් මතු වේ. දෙවියන්වහන්සේ මිනිස් දුක සහ වේදනාවෙන් දුරස්ථව නොසිට එම අත්දැකීමට සම්පූර්ණයෙන්ම මුහුණදීම

එම සිද්ධාන්තයේ අවම අදහස ලෙස සැලකිය හැකිය. එබැවින් කිතුනුවා වනාහි දුක, වේදනාව සහ කොරෝනාවයිරස වැනි ගැටලු සියල්ලම නිරාකරණය කළ කෙනෙක් නොව, ඒ සියලු ආකාර වේදනාවන් විඳින පිණිස ආවා වූ දෙවි කෙනෙකු කෙරෙහි විශ්වාස කරන සහ එම දෙවියන්වහන්සේට ප්‍රේම කරන කෙනෙකි.

මෙය කථාන්දරයෙන් භාගයක් පමණි. එම දුක් විඳීමෙන් යේසුස් වහන්සේගේ කාර්යභාරය හමාර වූවා නම්, ඒ ගැන කිසි කෙනෙක් දැනගන්නේවත් නැත. එය අවසානය නොවේ. පළමු පාස්කු දවසේ (එනම් යේසුස් වහන්සේගේ උත්ථානය දවස) යෙරුසලම තුළ මහත් ආන්දෝලනයක් ඇති කළේ - පළමු ශතවර්ෂයේ ලෝකය උඩු යටිකුරු කළේ - එම යේසුස් වහන්සේ මරණය ජය ගත්තාය යන පුවතයි: එතුමා නැවත මරණයෙන් නැගිට ඇති බවත් උන්වහන්සේ මානව සංහතියේ අන්තිම විනිශ්චයකරුවාණන් වහන්සේ වන්නට යන බවට වූ පුවතය.

මෙහි වැදගත්කම අධිතක්සේරු කළ නොහැකිය. අදේවවාදී ලෝකදෘෂ්ටියට දරාගත නොහැකි මූලික ගැටලුවක් එයින් මතු වේ: අවසාන යුක්තිය පිළිබඳ ගැටලුව. අප කවුරුත් දන්නා පරිදි, ගණන් කළ නොහැකි මනුෂ්‍යයන් සංඛ්‍යාවක් ඉතිහාසය පුරාවටම බරපතළ ලෙස අයුක්තියට මුහුණදී ඇති අතර, ඒ නිසා දුක්ඛිත ජීවිත ගත කළ ඔවුන්, කිසිදු පිළියමක් නැතුව මරණයට පත් වී ඇත. කොරෝනාවයිරසයෙන් මරණයට පත් වන සමහරෙකුගේ තත්වයත් එසේම විය හැකිය. එවන් මිනිසුන්ට මේ ජීවිතයේදී යුක්තිය ඉෂ්ට

වුයේ නැත. අදේවවාදයට අනුව, සියල්ලේම අවසානය මරණය නිසා, යුක්තිය ගැන බලාපොරොත්තු තබාගත හැකි ජීවිතයක් ඇත්තේ නැත. අවසාන විනිශ්චයක් නැත්නම්, අවසාන යුක්තියක්ද ඇත්තේ නැත.

එම යුක්තිය මායාවක් නොවන බවත්, යුක්තිය උදෙසා අපගේ අභිලාෂය නිරර්ථක නොවන බවත් නැවත නැගිටීම ප්‍රසිද්ධියේ හඬ නගා කියා සිටියි. මේ ලෝකයේ දූෂිතයින්, ත්‍රස්තවාදීන් සහ වෙනත් නපුරු මිනිසුන් සහ ගැහැනුන් එක දවසක යුක්තිය ඉදිරිපිටට ගෙන එනු ලැබේ. මේ කාරණාව මා අදේවවාදීන්ට තේරුම් කර දීමට උත්සාහ කළ විට, ඔවුන් පවසන්නේ යුක්තිය උදෙසා මේ ලෝකයේදී ක්‍රියා කළ යුතු බවයි. මා එයට එකඟ වන්නේ යුක්තිය උදෙසා ක්‍රියා කිරීම ක්‍රිස්තියානි වගකීමක් බැවිනි. එහෙත් මා ඔවුන්ට පෙන්වා දෙන්නේ ඒ කෙසේ වෙතත් අවසාන යුක්තිය නමැති ගැටලුවට එයින් විසඳුමක් නොලැබෙන බවය. අදේවවාදයට මේ සඳහා විසඳුමක් ඇත්තේම නැත. අදේවවාදය අපගේ සදාචාරයට නිග්‍රහයකි.

ඊට ප්‍රතිවිරුද්ධව, අවසාන යුක්තිය යථාර්ථයක් බව බයිබලයේ මතයයි. සදාචාර නීතිය පිටුපස සිටින්නේ දෙවියන්වහන්සේ බැවින් උන්වහන්සේ එය දෝෂහරණය කරනු ඇත. එබැවින්, එහි ප්‍රතිඵලයක් ලෙස, මේ ලෝකයේ එදා මෙදාතුර සිදු වූ සැම අසාධාරණයක් වෙනුවෙන්ම, අවසාන විනිශ්චයක් ඉදිරියේදී සිදු වන්නට යයි. යුක්තිය යන්න විහිළුවක් නොවේ. ක්‍රිස්තියානි අපෝස්තුළුවර පාවුල් තුමා අතීනසයේ ඇරියෝපගස් මන්ත්‍රණ ශාලාවේ දාර්ශනිකයන්ට කථාවක් පවත්වමින්

කියා සිටියේ යේසුස් වහන්සේ මරණින් නැවත නැගිටි බවත්, ඒ වන විට ලෝකයේ විනිශ්චයකරුවාණන් වහන්සේ ලෙස පත් කර ඇති බවත්ය: එය මිනිසාගේ ගැඹුරුම ගැටලුවට අවසාන පිළිතුරක් අවසානයේදී ලැබෙන්නට යන බවට එය ප්‍රතිඥාවක් විය.[32]

මනුෂ්‍යයා තුළ යුක්තිය කෙරෙහි විශාල අවශ්‍යතාවක් ඇතුවා සේම, මිනිසා සිරිතක් වශයෙන් අවසාන යුක්තිය පිළිබඳ පණිවුඩයට දැක්වූයේ සෘණවාදී ප්‍රතිචාරයකි. ඊට හේතුව එහිදී දෙවි කෙනෙක් පිළිබඳ ප්‍රශ්නය පැනනැගීමය. “එවැනි දෙවි කෙනෙක් කෙරෙහි මට විශ්වාස කරන්න බැහැ” යයි සමහරෙකු පවසන්නේ සදාචාරාත්මක නපුරට විරුද්ධ වෙමින් සහ දෙවියන්වහන්සේ ඒ පිළිබඳ මැදහත්කම් නොකරන බව පවසමිනි. දෙවියන්වහන්සේගේ අනාගත යුක්තිය ගැන අපේ ස්වාභාවික ප්‍රතිචාරයේ ඇති ගැටලුව මෙයයි: දෙවියන්වහන්සේගේ මැදහත්වීම අප ගැන නොවන තාක් කල්, එය අනුන් සම්බන්ධව නම්, එය පිළිගැනීමට අප සූදානම්ය.

සත්‍යය නම් අප අන්‍යයන් තුළ නපුර දකින අතර, අප තුළ එය නොදැකීමයි. එබැවින් දෙවියන්වහන්සේ කුමක් කළ යුතුදැයි අපි සිතන විට අප කල්පනා කරන්නේ දෙවියන්වහන්සේ අප නොව, අප වටා සිටින නපුරු අය නැති කර දැමිය යුතුය කියාය. ඇරත් අප ඒ අය තරම් නපුරු නැහැ නේ! එහෙත් බයිබලය අපට උගන්වන්නේ “සියල්ලෝම පව් කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනව” සිටින බවයි.[33] අපට දෙවියන්වහන්සේගේ සදාචාරාත්මක ප්‍රමිතීන්

කෙසේ වෙතත් අපගේම ප්‍රමිතීන්වත් පවත්වාගෙන යාමට නොහැකි වී ඇත. දස පනත දෙස බැලූ විට එය පැහැදිලි වෙයි.[34] එබැවින් අප සහ දෙවියන්වහන්සේ අතරට එන, පාපය සහ දෝෂාරෝපණයේ ප්‍රශ්නයට අපට කිසියම් විසඳුමක් අවශ්‍ය කර ඇත.

ක්‍රිස්තියානි ධර්මයට අනුව, එම විසඳුම ඇත්තේද යේසුස් වහන්සේගේ කුරුසිය සහ නැවත නැගිටීම තුළමය. මෙම සිදුවීම් අපට දුක සහ වේදනාවට ප්‍රවේශයක් හෝ යුක්තිය පිළිබඳ ප්‍රශ්නයට විසඳුමක් ගෙන නොදෙයි. එය යේසුස් වහන්සේගේ නමේ තේරුම අපට කියා දෙයි. එහි අර්ථය නම්, "සිය සෙනඟ ඔවුන්ගේ පාපවලින් මුදාලන්නේ එතුමාණෝය" යනුයි (මතෙ. 1.21). යේසුස් වහන්සේගේ මරණය සහ නැවත නැගිටීම කරණකොටගෙන, මිනිස් සංහතියේ දුක සහ වේදනාවට තම දායකත්වය ගැන පසුතැවිලි වන අය (එනම් "ආපසු හැරෙන අය") - යේසුස් වහන්සේ තම ස්වාමියා ලෙස විශ්වාස කරන අය - සමාව ලබන්නෝය; විශ්වය මවා පාලනය කරන්නාවූ දෙවියන්වහන්සේ සමග සමගි වන්නෝය; අලුත් බලයක් සහිත අලුත් ජීවිතයක් ආරම්භ කරන්නෝය; වේදනාව තව දුරටත් නැති ලෝකයක් ගැන පොරොන්දුවක් ලබන්නෝය. මෙහිදී ක්‍රිස්තියානි ධර්මය වෙන කිසිම ආගමක් හෝ දර්ශනවාදයක් සමඟ තරඟ කරන්නේ නැත - ඊට හේතුව, වෙන කිසිවෙක් අපට සමාව සහ මේ ජීවිත කාලය තුළ සහ සදාකාලයටම පවතින සහ දැනෙන දෙවියන්වහන්සේ සමග සමගි වීමක් පිරිනමන්නේ නැති නිසාය.

එසේනම්, කිතුනුවෙක් යනු දුක් විඳීමේ ප්‍රශ්නය විසඳා ඇති කෙනෙක් නොව, එම දුක අප වෙනුවෙන් දරා ගත්ත දෙවියන්වහන්සේට ප්‍රේම කරන සහ උන්වහන්සේ විශ්වාස කරන කෙනෙකි.

## කිරුළු දෙකක්

එසේ නම්, මෙය අපට ව්‍යසනයන් සහ වසංගතවලට සාර්ථකව මුහුණදීමට උපකාර වන්නේ කෙසේද? කොරෝනාවයිරසයට එම නම ලැබුණේ එය ඇත්තටම කිරුළක ස්වරූපය ගන්නා නිසාය (කොරෝනා යනු ලතින් භාෂාවෙන් කිරුළ යන්නය). කිරුළ බලයේ සහ ආධිපත්‍යයේ සංකේතයකි - සැබවින්ම මෙම වයිරසය මිනිසාට ඉහළින් විශාල බලයක් පෙන්නුම් කර ඇත. එය පියවි ඇසට නොපෙනුණත්, එය මිලියන නැත්නම් බිලියන ගණනාවක් සෙනඟකට කළ හැකි හෝ නොහැකි දේ තීරණය කර ඇත.

එමගින් අපට බලෙන්ම වාගේ අපගේ අන්තරායකර තත්වය මැනවින් පෙන්නුම් කරමින් තිබේ. මනුෂ්‍යයන් වන අප මැරෙන සුළු අය බව බොහෝ විට අපට අමතක වෙනවා. අප සහ මැවිල්ල අතර ඇති සම්බන්ධතාවයත්, මැවිල්ල අප සමග ඇති සම්බන්ධතාවයත් යන දෙකම අක්‍රමවත් බව කොරෝනාවයිරසය අපට පෙන්වා දී ඇත: මෙය හුදෙක් අහඹු සිදුවීමක් නොවේ.

එහෙත් බලාපොරොත්තුවක් ඇත්තේ වෙනත් කිරුළක් මතය (කොරෝනාවකය): යේසුස් වහන්සේගේ මරණයට කලින් උන්වහන්සේගේ හිසට තබා තද කළ කටුවලින්

සාදන ලද කිරුළ කෙරෙහිය.

එම කොරෝනාව මැවුම්කරුවාණන් වහන්සේ සහ මැවීම අතර පරතරය කොතරම්දැයි පෙන්නුම් කරයි. පොළොව, අපගේ නොව, දෙවියන්වහන්සේගේ මැවිල්ලයි. අපි එහි අයිතිකාරයෝ නොවුණද, උරුමක්කාරයන් වන්නට බලා සිටින්නෝ වෙමුව. අපි දැනට එහි, කුලීබදුකාරයෝ සහ භාරකරුවෝ වෙමුව. අපෙන් වැඩි දෙනෙකු අපගේම ජීවිත අවුල් කරගෙන අප අවට සිටින්නන්ගේද ජීවිත අවුල් කර ඇත. එසේ කල අප අතින් මහ පොළොවට සිදුව ඇති අපරාධය ගැන කවර කථාද? දෙවියන්වහන්සේ සමඟ සහභාගිකම ඇති එකක් සහ එවැන්නක් නැති එකක් වශයෙන් මිනිසා සඳහා පාරාදීස දෙකක් ඇත්තේ නැත. 'අපට පොළොව මත සම්පූර්ණත්වය ගොඩනැගිය හැකිය' යන මායාව මෙම වයිරසය ශීඝ්‍රයෙන් විනාශ කරමින් ඇත, ඊට අප මුලින් දැක්වූ මන්දගාමී සහ සංසුන් ප්‍රතිචාර මේ වන විට බිය, ඉච්ඡාභංගත්වය සහ ක්‍රෝධයට හරවමින් ඇත. මිනිසාගේ පාපයේ ප්‍රතිවිපාක නිසා බිඳුණා වූ ලෝකයක, වේදනාව සහ දුක් විඳීම නියතය. කොරෝනාවයිරසය ලොව පුරා ඇති කළ කලබලයට පෙර, සමහර විට අප මෙම යථාර්ථයෙන් සැඟවී සිටින්නට ඇත. දැන් අපට තවදුරටත් එය සහ ඉන් පැන නගින ජීවිතය සහ මරණය පිළිබඳ විශාල ප්‍රශ්නය නොතකා ඉන්නට බැරි තත්වයක් උදා වී ඇත. සී. එස්. ලූවිස්ගෙන් තවත් සිතුවිල්ලක්:

*"අපට සන්තුෂ්ටිය පවා නොතකා සිටිය හැකිය. එහෙත් වේදනාව අපට ඒ ගැන යමක් කරන මෙන් බල කරයි. දෙවියන්වහන්සේ අපගේ සන්තුෂ්ටියේදී මුමුණන සේක, හෘදය සාක්ෂියට කථා කරන සේක, වේදනාවේදී මොරගසන සේක. වේදනාව, බිහිරි ලොව අවදි කරන උන්වහන්සේගේ හඬයි."*[35]

සමහර විට කොරෝනාවයිරසය මහත් ශබ්ද විකාශන යන්ත්‍රයක් ලෙස ක්‍රියා කර, අවසාන සංඛ්‍යාලේඛන අපට මතක් කර දෙනු ඇත: අප හැමෝගෙන්ම එක් කෙනෙක් මැරෙන්නට යන බවට වන මෙම කරුණ, මෙය අප වසර ගණනාවක් තිස්සේ නොසලකා හැර ඇති දෙයකි. එහෙත් දෙවියන්වහන්සේ සමඟ නැවත සම්බන්ධතාවයක් ඇති කර ගැනීමටත්, මරණයෙන් ඔබ්බට ගිය, නව, නොබිඳුණු ලොවකට අප ගෙන ඒම සඳහා කටු ඔටුන්නක් පැලඳ සිටි දෙවියන්වහන්සේ දෙස බැලීමටත් මෙය අප පොළඹවන්නේ නම්, කොරෝනාවයිරසය, එමගින් වූ විනාශය හමුවේ වුවද අතිශයින් සුව සම්පන්න අරමුණක් ඉටු කරනු ඇත.

# 6. දෙවියන්වහන්සේ ඇති කරන වෙනස

කිතුනුවන් වසංගතවලට ප්‍රතිචාර දැක්විය යුත්තේ කෙසේද? මෙම ප්‍රශ්නයට විවිධ තලයන් කිහිපයක සිට පිළිතුරු දිය යුතුය.

## උපදෙස් පිළිපදින්න

මුලින්ම, ප්‍රායෝගික තලයෙන්, එම කාලය තුළ අපට ලබා දෙන හොඳම වෛද්‍ය උපදෙස් පිළිපැදීම අපට කළ හැකි බුද්ධිමත්ම දෙයයි. සමහර ප්‍රවෘත්ති ප්‍රචාරවල දකින ආකාරයට, එම විධි විධානයන් පරස්පර විරෝධී වන විට, ඉන් වියවුලක් ඇති වන විට, ප්‍රශ්නයක් ඇති වේ. වයිරසය පැතිරීම අවම කිරීම සඳහා, වඩාත් අවදානම් තත්වයක සිටි ජනතාව, එනම් වයෝවෘද්ධ සහ හෘදය රෝග සහ ශ්වසන රෝග ඇති අය සඳහා නිරෝධායනය යෝජනා කර ඇත. පුරාණයේ සමහර බෝ වන රෝග තත්වයන් පැතිරීම අවම කරන පිණිස ඉශ්රායෙල් සෙනඟට නිරෝධායනයේ අවශ්‍යතාවය පෙන්වා දුන් අවස්ථා ඇත. පැරණි ගිවිසුමේ ලෙවී කථාව පොතේ සමහර රෝග සඳහා දින හතක නිරෝධායන කාලයක් සහ වෙනත් රෝග සඳහා අවිනිශ්චිත කාලයක් නියම කර තිබුණි.[36]

වෛද්‍ය නිර්දේශ මත පදනම් වූ මෙවැනි උපදෙස්

පිළිපැදීම ඇඳහිල්ල නොමැතිකමක් නොවේය. දෙවියන්වහන්සේට අප සුව කරන්නත්, ආරක්ෂා කරන්නත් පුළුවන් බවට කිසිදු සැකයක් නැතත්, අප බුද්ධිමත්ව කටයුතු කිරීම සහ අපට ඇති සම්පත් උපරිමයෙන් භාවිත කිරීම උන්වහන්සේ අපගෙන් බලාපොරොත්තු වන සේක. සමාජ දුරස්ථතාවය ආත්මාර්ථකාමීකමක් නොව, අපගේ අසල්වාසීන්ට ආරක්ෂාව සලසන පිණිස ප්‍රේමය පෙන්නුම් කරන ක්‍රමයකි. අඩු අවදානමක් ඇති අයට (තත්වය සහ නීතියෙන් ඉඩ ලැබුණු විට) අසනීපයෙන් ඉන්නා අය බලන්නට යාම, දුබල අයට අවශ්‍ය බඩු ගෙනැවිත් දීම සහ තනිව සිටින අයගේ තනිය මැකීමට කටයුතු කිරීම වැනි දේ කිරීමෙන් අසල්වැසියන්ට ප්‍රේම කිරීමේ සේවාවක් කළ හැකිය.

## දෘෂ්ටිකෝණය නිවැරදිව පවත්වාගන්න

'කිතුනුවන් පරමාණු ආයුධවලට ප්‍රතිචාර දැක්විය යුත්තේ කෙසේද'යි දක්වමින් සී.එස්. ලූවිස් වරක් ලිපියක් ලියුවේය. මම මෙහි ලා එහි කොටස් කිහිපයක් සඳහන් කරන්නෙමි: එහෙත් අද අපගේ තත්වයට අදාළ කරගන්නා පිණිස, අදාළ ස්ථානවල "කොරෝනාවයිරසය", "වයිරස්" හෝ "වසංගත" යනුවෙන් වෙනස් කර එම වචනවලට සතරැස් වරහන් යෙදුවෙමි (සමහර විට එය අසම්පූර්ණ උත්සාහයක් වන්නට හැකිය, ඒ ගැන මම ඔබගෙන් සමාව අයදිමි):

"සමහර විට අපි අවශ්‍ය පමණට වඩා පරමාණු බෝම්බ [කොරෝනාවයිරස] ගැන සිතනවා විය හැකිය. පරමාණුක [වසංගත] යුගයක අප ජීවත් වන්නට යන්නේ

කෙසේද?. වසංගත සැම වසරකම පැතිරෙන අතරතුර, දහසය වන සියවසේ එංගලන්තයේ මිනිසුන් ජීවත් වූවා සේ, නැතහෙත් වයිකිංග්ග් යුගයේදී ස්කැන්ඩිනේවියානු ආක්‍රමණිකයන් රාත්‍රියේ පැමිණ ඔබගේ ගෙල සිඳ දමන්න යනවා යයි දැන දැනත් ඔවුන් ජීවත් වූවා සේ: එසේත් නැත්නම් ඔබ දැනටමත් පිළිකා, සිෆිලිස්, අංශභාගය, ගුවන් ආක්‍රමණ, දුම්රිය අනතුරු, මෝටර රථ අනතුරු මධ්‍යයේ ජීවත් වන්නා සේ යයි පිළිතුරු දීමට මට සිතේ.”

*“වෙන වචනවලින් පැවසුවහොත්, මෙම තත්වයේ ඇති නවතම ස්වභාවය අපි අවශ්‍ය පමණට වඩා විශාල ලෙස ඇඟට නොගෙන සිටිමු. පරමාණු බෝම්බවලට [කොරෝනාවයිරසයට] පෙර ඔබත් ඔබගේ සගයින්වත් මරණයට නියම වී තිබුණි: අපෙන් වැඩි දෙනෙක් ඉතාම අප්‍රියජනක ආකාරයෙන් මිය යන්නට තිබුණි. අපගේ මුතුන්මිත්තන්ට නොතිබුණු එක වැදගත් වාසියක් ඔබටත් මටත් ඇත - එය නම් නිර්වින්දකයි. අපට එය අදටත් ඇත. එබැවින් මුහුණු දික් කරගෙන කොඳුරමින් එහා මෙහා යාම විකාරයකි, මන්ද, අපට වේදනාකාරී සහ අකල් මරණයක් සත්තකින්ම ළඟා කර දිය හැකි ආකාර අතරට, විද්‍යාඥයින් කොරෝනාවයිරසය හරහා තවත් එක් ආකාරයක් එකතු කළා පමණි.”*

*“මෙය පළමු කරුණය: එබැවින් අප විසින් කළ යුත්තේ කොන්ද කෙලින් තබා ගැනීමයි. අපි සියල්ලන්ම පරමාණු බෝම්බයකින් [කොරෝනාවයිරසයකින්] විනාශ වන්නට යනවා නම්,*

*එම බෝම්බය [වයිරසය] අප කරා එන අවස්ථාවේදී අපි කොහේ හෝ මුල්ලකට ගුලි වී බෝම්බයක් [වයිරසයක්] ගැන බයේ ගැහෙමින් සිටිනවා වෙනුවට, ප්‍රඥාගෝචර සහ මානුෂීය කටයුතුවල නිරත ව සිටිමු - යාච්ඤා කරමින්, වැඩෙහි යෙදෙමින්, උගන්වමින්, කියවමින්, සංගීතයට සවන් දෙමින්. දරුවන් නාවමින්, සෙල්ලම් කරමින්, මිතුරන් සමඟ අල්ලාප සල්ලාපයේ යෙදෙමින් ගත කරමු. ඒවාවලට අපගේ ශරීර සුනු විසුනු කළ හැකිය (ක්ෂුද්‍ර ජීවියෙකුට මෙය කළ හැකිය) එහෙත් ඒවාවලට අපගේ මනස පාලනය කිරීමට ඉඩ නොතබමු."*[37]

මේවා කියවීම අසීරු වුවද, ක්‍රිස්තියානි ඇදහිල්ල විකල්ප දෘෂ්ටිකෝණයක් ඉදිරිපත් කරන බව අමතක කළ නොහැකිය.

## ඔබේ අසල්වාසියාට ප්‍රේම කරන්න

තුන්වෙනුව, අප කැඳවා ඇත්තේ ප්‍රේම කිරීමටයි. මම මුලින්ම අප දන්නා පුරාතන වසංගත කිහිපයක් ගැන කථා කළෙමි. මා එහිදී සඳහන් නොකළ කරුණ වන්නේ එවන් වසංගත අතරතුර කිතුනුවන් ක්‍රියා කළ ආකාරයයි. ලයිමන් ස්ටෝන් විසින් මෑතකදී ලියන ලද "ක්‍රිස්තියානිය වසර 200ක් තිස්සේ වසංගත සමඟ ක්‍රියා කර ඇත" නම් වූ ලිපියේ මෙසේ ලියා ඇත:

*"ඉතිහාසඥයින් පවසන ආකාරයට දෙවන ශතවර්ෂයේ රෝම අධිරාජ්‍යයෙන් කාලක් පමණ මරණයට පත් කළ ඇන්ටෝනින් වසංගතය ක්‍රිස්තියානි ආගමේ ව්‍යාප්තියට හේතු විය. කිතුනුවෝ රෝගීන්ට උපස්ථාන කරමින්, වසංගතය වනාහි කෝපාවිෂ්ට දෙවිකෙනෙකුගේ ක්‍රියාවක් නොව බිඳුණු මැවිල්ල දෙවියන්වහන්සේට එරෙහිව කැරලි ගැසීමේ ප්‍රතිඵලයක් වන බව පෙන්වා දෙමින් නව ආත්මික රාමුවක් හඳුන්වා දුන්හ."*

*"තම දේශනාවලින් මෙම රෝගය ගැන විචිත්‍රවත් විස්තරයක් ඉදිරිපත් කළ බිෂොප්වරයෙක් වෙනුවෙන් නම් කරන ලද, සිප්රියන් වසංගතය, ඊට වඩා ප්‍රසිද්ධ වසංගතයක් ලෙස හැඳින්විය හැකිය. ඉබෝලා රෝගයට සමානකම් ඇති මෙම වසංගතය රෝම අධිරාජ්‍යය තුළ තුන් වන ශතවර්ෂයේ අර්බුදයට හේතු විය. එහෙත් ඊට වඩා වෙනස් යමක්ද එහිදී සිදු විය: එය නිසා කිතුනු දහමේ පුදුමාකාර වර්ධනයක් ඇති විය. සිප්රියන් දේශනාවලින් පැවසුවේ මරණයට පත් (ස්වර්ගයට ගිය) අය ගැන කනගාටු නොවී, ජීවත්ව සිටින අය රැක බලා ගැනීමේ කාර්ය දෙගුණ කරන මෙන්ය. ඔහුගේ සමකාලීන බිෂොප්වරයෙකු වූ දියොනීසියස් පැවසුවේ, කිතුනුවන් 'අනතුරු ගැන නොතකා.... රෝගීන් බැලුවා, ඔවුන්ගේ සෑම අවශ්‍යතාවයක් ගැනම සොයා බැලුවා' යනුවෙනි.*[38]

වසංගත අතරතුර, කිතුනුවන්ගේ මෙම ක්‍රියා කලාපය ගැන සඳහන් කළේ ඇදහිලිවන්තයින් පමණක්ම නොවේ. ඊට ශතවර්ෂයකට පසු අතිශයින්ම මිථ්‍යාදෘෂ්ටික අධිරාජ්‍යයෙක් වූ ජුලියන්, "ගලීලයන්" කිතුනු නොවන රෝගීන්ට පවා සලකනවා යයි දොස් තැබුවේය. එලෙසම සභා ඉතිහාසඥයෙක් වූ පොන්ටියේනස් 'කිතුනුවන් තම ඇදහිල්ලේ සෙනඟට පමණක් නොව, සැමට යහපත කිරීමට' අමතක නොකළ බව ලියා තැබුවේය.[39] සමාජ විද්‍යාඥයෙකු සහ ආගමික ජන විකාසනය පිළිබඳ විද්‍යාඥයෙකු වූ රොඩ්නි ස්ටාර්ක් කියා සිටි අන්දමට කිතුනුවන් පදිංචිව සිටි නගරවල මරණ ප්‍රතිශතය වෙනත් නගරවල මරණ ප්‍රතිශතයට වඩා හරි අඩකින් අඩුව පැවතිණි.[40]

මේ ආකාර ජීවිත කැපවීමෙන් සේවය කිරීම ඉතිහාසය තුළ නැවත නැවතත් ඉස්මතු වී ඇත. බුබෝනික වසංගතය 1527දී ජර්මනියේ විටන්බර්ග් නුවර ආක්‍රමණය කළ විට, මාර්ටින් ලූතර් තුමා (රෙපරමාදු සභාවේ ආරම්භක තුමා) ඉන් පළාගොස් තම ජීවිතය බේරා ගැනීමට ලැබුණු ආරාධනා ප්‍රතික්ෂේප කළේය. ඒ වෙනුවට ඔහු නගරයේම රැඳී සිටිමින් රෝගීන්ට උපස්ථාන කළේය. මේ නිසා ඔහුගේ දියණිය එලිසබෙත්ගේ ජීවිතය පවා නැති විය. ඒ නිසාම ඔහු ලියූ අත් පත්‍රිකාවේ, "වසංගතයේදී කිතුනුවන් පළා යා යුතුද" ලූතර් තුමා වසංගත අතරතුර කිතුනු ප්‍රතිචාරය පිළිබඳ පැහැදිලි ලෙස කරුණු දැක්වීය:

*"අපි අපගේ ක්‍රියාන්විතයේදී මැරෙමු. ක්‍රිස්තියානි වෛද්‍යවරුන්ට තම ඉස්පිරිතාල අතහැර යා*

*නොහැකිය, ක්‍රිස්තියානි ආණ්ඩුකාරවරයන්ට තම දිස්ත්‍රික්කය හැර දමා යා නොහකිය, ක්‍රිස්තියානි සභා පාලකවරුන්ට තම සෙනඟ අතරමං කළ නොහැකිය. වසංගතය අපගේ මෙහෙවර නිෂ්ප්‍රභ කරන්නේ නැත: එය මැරෙන්න වුවත් සූදානම් කුරුසිය බවට පරිවර්තනය වන්නේය.”*

ස්ටෝන්ගේ ලිපිය අවසන් වන්නේ මෙවැනි ප්‍රකාශනයකිනි:

*“සනීපාරක්ෂාව සහ සෞඛ්‍යය පිළිබඳ කිතුනුවාගේ චේතනාව හුදෙක් තමාගේම ආරක්ෂාව පමණක් නොව, ඒ තුළින් අසල්වැසියන්ට සේවය කිරීම උදෙසාය. රෝගීන්ට උපස්ථාන කිරීමට කැමැත්තෙන් සිටින අතර, මුලින්ම අප හොඳ සුවයෙන් සිටින අය ආසාදිතයන් නොකිරීමට වග බලාගත යුතුය. මුල් කිතුනුවන් යුරෝපය පුරා ප්‍රථම රෝහල් සැදූවේ වසංගත කාලය අතරතුර රෝගීන්ට ප්‍රතිකාර කිරීමට යොදාගත හැකි සෞඛ්‍යාරක්ෂිත ස්ථාන ලෙසය, අනවධානය නිසා ලෙඩ රෝග තවත් පැතිරීම මිනී මැරුමකට සමානය යන පදනම මතය”*

ස්ථාපිත කර ඇති නීති උල්ලංඝනය කර අපත් වෙනත් අයත් අනතුරේ හෙළීම කිසිසේත් නොකළ යුතු බව, විශේෂයෙන් ස්වයං-හුදෙකලාවේ යෙදෙන්නට සිදුව ඇති සහ අගුළු දමා ඇති අවස්ථාවක, අවධාරණය කරනු ලැබේ. අප හැකිතාක් දුරට, අපටම වැය වීමක්

සිදු වුවත්, අන්‍යයන්ට ප්‍රේම කළ හැකි ආකාර සොයා බැලිය යුතුය. මන්ද, දෙවියන්වහන්සේ තම පුත්‍රයාණන් වහන්සේගේ මරණය හරහා, සැම කිතුනුවෙකු හටම ප්‍රේම කළේ ඒ ආකාරයෙන් වන නිසාය. අපගේ අසල්වැසියාට ප්‍රේම කිරීම යනු ආහාර සහ මූලික අවශ්‍යතාවයන් පිළිබඳ ඇති ආත්මාර්ථකාමී ආකල්පය අතහැර දැමීමයි. මේ ආකල්ප නිසා සුපිරි වෙළඳසැල් හිස් වී සමහර අයට කිසිත් නැතුව හිස් අතින් යන්නට සිදුවීම් වැනි අවස්ථා ඇති වෙයි.

## සදාකාලය මතකයේ තබා ගන්න

බොහෝ විට අපට අමතක වන ක්‍රිස්තියානි උරුමයක් පිළිබඳ කථා කිරීමට මෙය ප්‍රවේශයක් ගෙන දෙයි. හතර වෙනුව, කිතුනුවන් සදාකාලය ගැන මතකයේ තබාගත යුතු බවය. මුල් කිතුනුවන් ජීවත් වූයේ භයානක ලෝකයකයි. ඔවුන් වටා විවිධ ආකාරයේ තර්ජන තිබූ අතර ආයුෂ අපේක්ෂාව කෙටිව පැවතුණි. ඔවුන්ට ආත්ම පරිත්‍යාගයෙන් යුක්තව අන්‍යයන් ගැන සිතමින් ජීවත් වීමට හැකියාව ලැබුණේ මරණින් ඔබ්බට විහිදුණු බලාපොරොත්තුවක් ඔවුන් සතුව තිබුණ හෙයිනි. සී.එස්. ලූවිස් තම කාලයට මෙන්ම අදටත් ගැළපෙන වදන් ලියමින් මෙසේ දක්වා ඇත:

> *"දුක් විඳීම ගැන ලියවුණු පොතක ස්වර්ගය ගැන කිසිවක් ලියැවී නැත්නම් එහි එහෙම පිටින්ම වැදගත් කොටසක් අතහැර දමා ඇත."*

> *"දේව වචනය සහ සම්ප්‍රදාය පුරුද්දක් ලෙස,*

*ස්වර්ගයේ ප්‍රීතිය සහ පොළොවේ දුක් විඳීම එකම තරාදියක දෙපැත්තට දමයි. වේදනාවේ ප්‍රශ්නය පිළිබඳ ඉදිරිපත් කරන විසඳුමක එය එසේ සිදු නොවුණා නම් එය ක්‍රිස්තියානි විසඳුමක් වන්නේ නැත. අද බොහෝ දෙනා ස්වර්ගය ගැන කථා කරන්නට පවා ලජ්ජා වෙයි. අහස් මාලිගා තනන්නන් ලෙස බොහෝ දෙනාගේ හාස්‍යයට ලක් වන්නට සිදු වේ යයි බියක් අපට ඇත.... එහෙත් අහසේ මාලිගාවක් ඇත, නොඑසේ නම් අහසේ මාලිගාවක් නැත. එසේ නැත්නම්, ක්‍රිස්තියානි ධර්මය බොරුවකි. මන්ද මෙම දේව ධර්මය එහි සෑම අංශයකටම අතුළත් කර ඇති නිසාය. එවැන්නක් ඇත්නම්, මෙම සත්‍යතාවයට, අන් සෑම සත්‍යතාවයකට මෙන්ම අප මුහුණදිය යුතුය.”*[41]

පුරෝගාමී ක්‍රිස්තියානි අපෝස්තුළු පාවුල් තුමා අනාගතය පිළිබඳ තමාගේ විශ්වාසයන් සහ අවබෝධය කියා පෑමට ලජ්ජා වූයේ නැත:

*“මේ ජීවිතයේ දුක් වේදනා, අපට මතු එළිදරව් වන්නට යන මහිමය සමඟ කිසි සේත් සැසඳිය නොහැකි යයි කල්පනා කරමි.... මන්ද, මරණයටවත්, ජීවිතයටවත්, දේව දූතයන්ටවත්, භූතාධිපතීන්ටවත්, බලධාරීන්ටවත්, දැන් තිබෙන කිසිවකටවත්, මතු පැමිණෙන කිසිවකටවත්, අති උසටවත්, මහා ගැඹුරටවත්, මුළු විශ්වයෙහි අන් කිසි මැවිල්ලකටවත් අපගේ ස්වාමින් වන යේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළ ඇති දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් අප වෙන් කළ*

*නොහැකි බව මම ඒකාන්තයෙන්ම දනිමි" (රෝම 8.18, 38-39).*

මේ වචන වූ කලි හාන්සි පුටුවක් මත අසුන් ගෙන සිටින දාර්ශනිකයෙකුගේ වචන නොව, ජීවිතයේ රළුම සහ දුක්ඛිතම පැත්ත අත්දුටු මනුෂ්‍යයෙකුගේ වචනය. පාවුල් තුමා නිතරම ගුටි කෑවේ සහ සිරබත් කෑවේ අසාධාරණ ලෙසය. සමහර අවස්ථාවල ඔහු මැරෙන්නට ඇතැයි සිතා මිනිස්සු ඔහු හැර ගියහ. තවද, නැති බැරිකම් මෙන්ම අධික දුෂ්කරතාවලටද මුහුණ දෙන්නට ඔහුට සිදු විය.

විටෙක මමද පාවුල් තුමා මෙන්, මහිමාන්විත ස්වර්ගීය රාජ්‍යය මොන වගේදැයි කල්පනා කරමි. එවැනි අවස්ථාවල මා තුළ පැනනගින ප්‍රශ්නය මෙයයි: එක මොහොතකට පෙනෙන සහ නොපෙනෙන දෙලොව වෙන් කරන එම තිමිරය අයින් කර, මෙලොවින් ඉකුත් වූවන්ගේ වර්තමාන තත්වය අපට දැකගන්නට ලැබුණහොත් - දුෂ්ට රාජ්‍යයන් දියත් කළ භයංකර නපුර නිසා දුක් විඳ මරණයට පත් වුන ශතසහස්‍ර සංඛ්‍යාත අහිංසක කිතුනුවන්, යුධ අධිපතීන් සහ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හෝ වසංගත සහ ස්වාභාවික ව්‍යසනවලින් මිය ගිය අහිංසක මිනිසුන් - ක්‍රිස්තුස් වහන්සේ ගැන අප දන්නා කරුණුවල ආලෝකයෙන්, දෙවියන්වහන්සේ තත්වය කළමනාකරණය කරන ආකාරය පිළිබඳ අපට ඇති ගැටලු සියල්ල නිරාකරණය නොවනු ඇත්ද? අප තවමත් අනෙත් ලෝකයට එළඹී නැත, එනමුත් ඉන් නික්මුණු පණිවුඩයක් අප සතුව ඇත. එය මෙම වයිරස් ආසාදිත ලෝකය ඇසිය යුතුම පණිවිඩයකි.

## තරණය කිරීම

එවැනි දේ ගැන ලියන්නට මා කවුද? මෙම වචන කියවන අයගෙන් බොහෝ දෙනෙකුට මෑතකදී තම ආදරණීය අයෙකු අහිමිව ඇති බව වේදනාවෙන් යුතුව තේරුම් ගනිමි. එවැනි කෙනෙක් සමහර විට මෙසේ කියනු ඇත: "ඔහු මොනවද මේ දේවල් ගැන දන්නේ?" එයට මට දිය හැකි පිළිතුර නම්, මට වඩා වේදනාව සහ දුක ගැන හොඳින් දන්නා අය ඕනෑ තරම් ඇති බැවින් ඔවුන්ට මට වඩා හොඳට ඔබේ වේදනාව තේරුම් ගැනීමට පුළුවන්කම ඇති අතර මේ තත්වය මැද වුවද බලාපොරොත්තුවක් ඇති බව පමණක් මට සහතික කොට කිව හැකිය යන්නයි. දකුණු අප්‍රිකාවේ ජොසෑන් මොස් සහ මහා බ්‍රිතාන්‍යයේ මයිකල් වෙනම් යන දෙදෙනා විසින් ඔවුන්ගේ වේදනාවේ ගමන්මඟ ගැන ලියන ලද අපූරු පොතකින් උපුටා දක්වමින් මා මෙය අවසන් කරන්නට කැමතියි. ඔවුන් දෙදෙනාම චාලක නියුරෝන රෝගය (motor neurone disease), නම් සුව කළ නොහැකි රෝගයකින් පෙළෙන අතර ඔවුන් එකිනෙකා හමු වී ඇත්තතේ විද්‍යුත් ලිපි පණිවිඩ ආශ්‍රයෙන් පමණි.

ජොසෑන් තම ගමන්මඟ කන්දක් තරණය කිරීමට සමාන කරයි. අවංකභාවයෙන් සහ ධෛර්යයෙන් යුතුව ඇය දෙවියන්වහන්සේ තමා දරා සිටිය ආකාරය විස්තර කරයි:[42]

*මම මේ කන්ද වසර 15ක් පමණ තිස්සේ තරණය කරමින් සිටිමි. වැඩිපුර කාලයක් මා ගත කළේ කන්ද පාමුල පිහිටි පර්යන්ත කඳවුරේ දෙවියන්වහන්සේ*

*මා සූදානම් කරන බව දැනගෙනය. කඳු නැගීමට මම කොහොමත් බියෙන් සිටි නිසා පර්යන්ත කඳවුර මගේ එකම අරමුණ යයි මම සිතා සිටියෙමි. කිසිදිනෙක කඳු මුදුනට නැගීමට පුළුවන් වෙතැයි මම නොසිතුවත්, මගේ රෝගය කරණකොටගෙන මේ කිසිවක් මා පිළිබඳ හෝ මට කළ හැකි දේ පිළිබඳ නොවේය යි දෙවියන්වහන්සේ මට පෙන්වා දුන් සේක. සියල්ලක්ම උන්වහන්සේ පිළිබඳය. 'මා ශක්තියෙන් සන්නද්ධ කරන්නේ සහ මාගේ ගමන පිරිපුන් කරන්නේ දෙවියන්වහන්සේමය. උන්වහන්සේ මාගේ දෙපා මුවෙකුගේ දෙපා මෙන් වෙන්නට සලස්වන සේක; මට උස් තැන්හි නැගී සිටීමට උන්වහන්සේ මා බලවත් කරන සේක.'*[43]

*අන්තිමේදී මම මගේ පර්යන්ත කඳවුර අතහැර දමා කන්ද නැගීම ආරම්භ කළෙමි. දෙවියන්වහන්සේ මා වෙනුවෙන් තෝරාගෙන තිබුණේ එවරස්ට් කන්දමය. එය පහසු කාර්යක් නොවීය, මගේ දෙපා නිතරම ලිස්සා වැටුණි. බොහෝ අවස්ථාවලදී මට අධික වෙහෙස දැනුණි තවදුරටත් ගමන් කළ නොහැකි යයි සිතුණු අවස්ථා එමටය. මෙම කන්දේ සමහර ස්ථාන අධික බෑවුම් සහිත බැවින් මට කිසිසේත්ම තරණය කළ නොහැකි ලෙස දැනුණත්, උන්වහන්සේගේ බලය සහ ශක්තිය මට දිගටම පෙන්නුම් කෙරුණා. මට වෙහෙස වැඩි වන විට උන්වහන්සේ එතැන වූ සේක. 'එහෙත්, සමිඳුන් සරණ යන්නෝ සිය සවිය අලුත් කරගන්නෝය; ඔවුහු රාජාලීන් මෙන් පියාපත් විදහා*

*යන්නෝය: ඔවුහු දුවන්නෝය: එහෙත්, වෙහෙස නොවන්නෝය: ඇවිදින්නෝය: එහෙත්, ක්ලාන්ත නොවන්නෝය.'*[44]

*මගේ තරණය කිරීමේ අගට මම පැමිණ ඇත්තෙමි. මට හිතෙන ආකාරයට මගේ කන්දේ මුදුනට මා ළඟා වී ඇත. කඳු නගින්නන් ඉහළට නගින්න නගින්න ඔවුන් කඳු මුදුනට ළඟා වෙතත්, ඔවුන්ට හුස්ම ගැනීම අමාරු වෙන්නට පටන් ගනියි. උන්නතාංශය (උස) වැඩි වීමත් සමඟම ඔක්සිජන් සාන්ද්‍රණය අඩු වේගන යන බැවින් කඳු නගින්නන් උන්නතාංශ රෝගවලින් පෙළෙන්නට පටන් ගනී. (අන්තර්ජාලයට අනුව: උන්නතාංශ රෝග ලක්ෂණ නම් හිසරදය, හුස්ම කෙටි වීම, නින්ද නොයාම, කෑම අරුචිය, ඔක්කාරය සහ අධික නාඩි ස්පන්දනය) චාලක නියුරෝන රෝගය වර්ධනය වීමත් සමඟ ශරීරයේ මාංශ පේශි දුර්වල වෙත්ම, හුස්ම ගැනීමට අවශ්‍ය කරන මාංශ පේශීන්ද දුර්වල වෙන්නට පටන් ගනී. මගේ හුස්ම දැන් කෙටිය, නිතරම හිසරදය, නිදා ගැනීමට අමාරුකම සහ අධික නාඩි ස්පන්දනයත් සිදු වේ. එහෙත් මට ඒ ගැන එතරම් තැකීමක් ඇත්තේ නැහැ, මන්ද, මා දැන් කඳු මුදුනට ළඟා වී ඇති බව දන්නා නිසාය. කන්ද නැගීම ඉතා අසීරු වුවත් මා දිගටම යා යුතුය. මා මේ නැගීම හමාර කළ විට මා වෙනුවෙන් සූදානම් කර ඇති ත්‍යාගය ඕනෑම අයෙකු කරන මේ පරිත්‍යාගවලට වඩා වටින්නේය. ඕනෑම කඳු නගින්නෙකු මෙය තහවුරු කරනු ඇත!*

*දැන් මම මෙහි නැගිට සිටිමින් ඉහළ බලමි. අවසානය ළඟම ඇති නිසා මගේ හදවත වේගයෙන් ස්පන්දනය වෙයි. 'මම යහපත් සටනෙහි සටන් කෙළෙමි. මම දිවීම අවසන් කෙළෙමි, මම ඇදහිල්ල රක්ෂා කෙළෙමි' යයි පැවසීමට ලැබෙන දවස ගැන මම උදක්ම බලා සිටිමි.*[45]

පාවුල් තුමාගේ එම වචනවලට එතුමා පහත වචනද එක් කළේය:

*"දැහැමි ජීවිතයක කිරුළ මට දැන් වෙන් කර තිබේ. ඒ මහා දවසේදී සාධාරණ විනිශ්චයකාර සමිඳාණන් වහන්සේ එය මට ලබා දෙන සේක. මට පමණක් නොව, උන්වහන්සේගේ ප්‍රකාශ වීම ආශාවෙන් බලාපොරොත්තු වන සියල්ලන්ටද එය දෙන සේක" ( 2 තිමෝ. 4.8).*

එක්තරා දිනක යේසුස් වහන්සේ පෙනී සිටිනු ඇත. ඒ දිනය ගැන දීර්ඝ කාලයකට පෙර උන්වහන්සේ තම ගෝලයින්ට පොරොන්දු වූ සේක:

*"සමාදානය ඔබ වෙත ප්‍රදානය කර යමි; මාගේ සමාදානය ඔබට දෙමි. මා එය ඔබට දෙන්නේ ලෝකයා දෙන්නාක් මෙන් නොවේ. ඔබේ සිත් කැලඹෙන්නටවත් බිය වන්නටවත් ඉඩ නොදෙන්න. 'මම ගොස් නැවත ඔබ වෙතට එමි'යි මා ඔබට කී බව ඔබ ඇසුවාහුය. ඔබ මට ප්‍රේම කළාහු නම් මා පියාණන් වහන්සේ වෙතට යන බැවින් ඔබ*

*ප්‍රීති වන්නහුය. මන්ද, පියාණන් වහන්සේ මට වඩා උතුම්ය (යොහන් 14.27-28).*

"මම ගොස් නැවත ඔබ වෙතට එමි" යයි එතුමා කී සේක. මේ වචන ලියා තබන යොහන්, යේසුස් වහන්සේ එදින පැමිණෙන විට රැගෙන එන්නට යන දේ වන නව මැවිල්ලක් ගැනද පවසයි:

*"ඉන්පසු මම අලුත් අහසක්ද අලුත් පොළොවක්ද දිටිමි. පළමු අහසත් පළමු පොළොවත් පහව ගියේය. මුහුදද තවත් නො වීය... දෙවියන්වහන්සේම ඔවුන් සමඟ වැඩවසමින්, ඔවුන්ගේ දෙවියන්වහන්සේ වන සේක. උන්වහන්සේ ඔවුන්ගේ දෙනෙතින් සියලු කඳුළු පිසදමන සේක. මරණය තවත් නැත. වැලපීමද හැඬීමද, වේදනාවද තවත් නැත. ඒ පළමු පිළිවෙළ පහව ගිය බැවිනි" (එළි. 21.1, 3-4).*

කොරොනාවයිරසය ඇතුළු ලෝකය වැනසූ සියලු වසංගත තව දුරටත් නැති වන්නේය: යේසුස් වහන්සේට ප්‍රේම කළා වූ සෙනඟට ලැබෙන්නට යන ධර්මිෂ්ඨකමේ කිරුළ කිසිදාක දිරාපත් වන්නේ හෝ මැලවෙන්නේ නැත. වසංගතයක් අතරතුර සමාදානය? එය ලබා දෙන්නට පුළුවන් යේසුස් වහන්සේට පමණී. අප සැම දෙනාටම ඇති ප්‍රශ්නය මෙයයි: එය ඉටු කරන පිණිස අපි එතුමා විශ්වාස කරනවාද?

# පසුවදන

මෙම අර්බුදය නිසා පැන නැගුණු ප්‍රශ්න සියල්ලට මා පිළිතුරු දුන්නාද? නැහැ, මා හිතන්නේ නැහැ. එය අසලට හෝ එන්නට මට නොහැකි වුණා. සමහර කරුණු පිළිබඳ තරමක රළු ස්ථාන මටද ඇති බැවින් ඒවා ගැන මීට වඩා පැහැදිලි කිරීමක් මටද අවශ්‍යය. එක්තරා දිනක මට සියල්ල පැහැදිලි වනු ඇත:

> *"දැන් අපට කැඩපතකින් මෙන් නොපැහැදිලිව පෙනෙන්නේය. මතු අපි මුහුණට මුහුණ ලා දකින්නෙමු. දැන් මාගේ දැනුම අසම්පූර්ණය. එහෙත් මතු, මා පිළිබඳ දෙවියන්වහන්සේගේ දැනුම මෙන් මාගේ දැනුමද සම්පූර්ණ වන්නේය" (1 කොරි. 13.12).*

ඒ අතර වාරයේදී මම දහනව වන ශතවර්ෂයේ ශ්‍රේෂ්ඨ දේශකයා වූ, චාර්ලිස් හැඩ්න් ස්පර්ජන්ගේ අවවාද පිළිපදිමි:

> *"දෙවියන්වහන්සේගේ බලවත් යහපත්කම නිසා උන්වහන්සේ අකරුණාවන්ත වන්නේ නැත. උන්වහන්සේට වරදින්නට බැරි තරම් ප්‍රඥාවන්තය. අපට උන්වහන්සේගේ හස්තය සොයා ගැනීමට නොහැකි වන විට, අප උන්වහන්සේගේ හදවත*

*විශ්වාස කළ යුතුය.”*[46]

මෙය කියවීම නිසා ඒ දේ කිරීමට ඔබට අවශ්‍යතාවක් ඇති වූ බව මගේ බලාපොරොත්තුවයි. එසේ නැත්නම්, අඩු තරමින්, කටු ඔටුන්නක් පැලඳි එම දෙවියන්වහන්සේ වෙනුවෙන් ඔබගේ කාලය සහ සිතුවිලි වැය කිරීමට වටිනවා යයි ඔබට සිතුණා යයි සිතමි. ඉදිරි මාස සහ වසරවල කුමනාකාර තත්වයක් උද්ගත වුවද, ඔබට බලාපොරොත්තුවක් සහ සමාදානය දීමට හැකි වන්නේ එතුමාට පමණදැයි තවදුරටත් විමර්ශනය කර බලනු ඇතැයි මගේ බලාපොරොත්තුවයි.

# අධෝ සටහන්

1 *Report of the WHO-China Joint Mission on Coronavirus Disease 2019 (COVID-19) (Feb. 2020).*
2 "NIH Director: 'We're on an Exponential Curve'" in *The Atlantic*, 17 Mar. 2020.
3 mphonline.org/worst-pandemics-in-history (accessed on 20 Mar. 2020).
4 *citizen.co.za/news/south-africa/courts/2256298/pray-in-groups-ofno-more-than-70-twice-a-week-forthe-sake-of-sa-mogoeng (accessed 20 Mar. 2020).*
5 *"God vs. Coronavirus" in The New York Times, 10 Mar. 2020.*
6 *theguardian.com/world/2020/mar/13/first-covid-19-casehappened-in-november-chinagovernment-records-show-report (accessed 23 Mar. 2020).*
7 *Crime and Punishment (Clayton, 2005), p 233.*
8 *Collected Letters, Vol. 3, (New York, 2000), p 520. Lewis is not saying here that creatures—humans—literally become God. He is rather referring to the fact that becoming a Christian through trusting Christ means that we are brought into God's family as his sons and daughters (see John 1 v 12-13; John 3 v 1-21).*
9 *The Universe Next Door (IVP, 2010).*
10 *Karma (in Hinduism and Buddhism) is the sum of a person's actions in one of their successive states of existence, which is regarded as deciding their fate in the next.*
11 *Job 42 v 7-9.*
12 *Job 1 v 13-19.*
13 *See, for example, John 9 v 1-3.*
14 *4 1 Corinthians 11 v 20.*
15 *Dialogues Concerning Natural Religion, part 10 (1779).*
16 *River Out of Eden (Basic Books, 1992), p 133.*
17 *The Brothers Karamazov (1880), book 11, chapter 4.*
18 *"Time to Stand Up" (Freedom From Religion Foundation, 2001).*
19 *Virtue Ethics (New York, 1991), p 2-3.*
20 *The Will to Power (1888), p 389.*
21 *Twilight of the Idols (Penguin, 1990), p 80-81.*
22 *The Gay Science (Vintage, 1974), p 282.*
23 *The Miracle of Theism (Clarendon Press, 1982), p 115-116.*
24 *weforum.org/agenda/2015/11/ are-viruses-actually-vital-for-ourexistence (accessed 20 Mar. 2020).*
25 *Rare Earth (Springer, 2000).*
26 *6 James 1 v 13.*
27 *I have dealt with this matter in considerable detail in my book Determined to Believe? (Lion Hudson, 2017).*
28 *Translation by D W Gooding MRIA.*
29 *The Gulag Archipelago (Collins, 1974), p 168.*
30 *Black Mass (Farrar, Straus, and Giroux, 2007), p 198.*
31 *See my Gunning for God (Lion Hudson, 2011), chapter 7, for more detail on this issue.*
32 *Acts 17 v 31.*
33 *Romans 3 v 23.*
34 *Exodus 20 v 3-17.*
35 *The Problem of Pain (Geoffrey Bles, 1940), p 81.*
36 *Leviticus 13 v 1-46.*
37 *"On Living in an Atomic Age" in Present Concerns: Journalistic Essays (1948).*
38 *foreignpolicy.com/2020/03/13/christianity-epidemics-2000years-should-i-still-go-to-churchcoronavirus (accessed 20 Mar. 2020).*
39 *As above.*
40 *As above.*
41 *The Great Divorce (Signature Classics, 2012), p 427.*
42 *I Choose Everything (Lion Hudson, 2010), p 176-178*
43 *Samuel 22 v 33-34.*
44 *Isaiah 40 v 33.*
45 *2 Timothy 4 v 7.*
46 *goodreads.com/quotes/1403154god-is-too-good-to-be-unkind-andhe-is (accessed on 20 Mar. 2020).*

මෙම පොත කියවීම ගැන ඔබට ස්තුතියි. ඔබට එයින් තෘප්තියක් සහ උපකාරයක් ලැබුණා යයි අපි විශ්වාස කරමු.

බොහෝ දෙනා ජීවිතයේ විශාල ප්‍රශ්න වලට පිළිතුරු සොයති: අපි කවුද? ඇයි අපි මේ පොළොවේ සිටින්නේ? අපි ජීවත් විය යුත්තේ කෙසේද? නුමත්, විවිධ සාධාරණ හේතු මත එවැනි දේ ගැන ධනාත්මකව සහ පරෙස්සමින් සිතීමට, කාලය හෝ නිවැරදි අවකාශයක් අපට නොලැබේ.

සමහර විට ඔබත් පිළිතුරු සොයන කෙනෙක් විය හැකිය. සමහර විට එවැනි දේ ගැන වැඩිය කම්පා නොවන හෝ තේරුම් කර දීමට නොහැකි කිතුණුවන් ඔබට මුණ ගැසෙන්නට ඇති. එසේත් නැත්නම් විශ්වාස කරමින් වර්ධනය වූ ඔබට කරුණු පැහැදිලි කර ගැනීමේ අවශ්‍යතාවය ඇති. බයිබලයේ පිටු අතර සම්භ වෙන ක්‍රිස්තියානි පණිවිඩය ඕනෑම වයසක හෝ තළයක සිටින අයට තේරුම් ගැනීම සඳහා උපකාර වීමට යහපත් පොත් සමාගමේ (The Good Book Company) අපි ඇප කැප වී සිටිමු.

මෙවන් විශාල ප්‍රශ්න වලට මුහුණ දෙන අවස්ථාවේදී, ඔබ කවුරු වුවත්, ඔබ කොහේ සිටියත්, ඔබට උපකාර කිරීමට හැකි වේය යනු අපගේ එකම පැතුමයි. බයිබලය නම්වූ එම යහපත්ම පොත වෙතට සහ එහි මධ්‍ය ලක්ෂයේ සිටින යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙතට හැරී, ජීවිතයේ විශාලතම ප්‍රශ්න වලට පැහැදිලි පිළිතුරු ලබා ගැනීමට උපකාර කිරීම ප්‍රකාශකයෙක් ලෙස අපගේ අදිටනයි. අපගේ වෙබ් අඩවිය වෙත පිවිස, අපගේ අනෙකුත් පොත්, විඩියෝ පට සහ වෙනත් දෑ ගැනත් යේසුස්වහන්සේ කවුද, උන්වහන්සේ ආවේ ඇයිදැයි වඩාත් පැහැදිලි අවබෝධයක් ලබා ගන්න. www.christianityexplored.org

කියවීම ගැන ස්තුතියි,

යහපත් පොත් සමාගමේ ඔබගේ මිතුරන්

thegoodbook.com | thegoodbook.co.uk
thegoodbook.com.au | thegoodbook.co.nz | thegoodbook.co.in

**WWW.CHRISTIANITYEXPLORED.ORG**

අපගේ හවුල්කාර වෙබ් අඩවියද ක්‍රිස්තියානි ඇදහිල්ල ගැන විමසා බැලීමට ඉවහල් වෙන, බලවන්ත සාක්ෂි සහ අමාරු ප්‍රශ්න වලට පිළිතුරු සපයන ස්ථානයකි.

අප දැන් ජීවත් වන්නේ සුවිශේෂී, යුගයක් අර්ථකථනය කරන වකවානුවකයි. නිශ්චිත යයි සිතූ දේවල් බොහොමයක් මෙන්ම, අප ලෝකය ගැන සිතා සිටි ආකාරය සහ අපගේ විශ්වාසයන් දැන් ඇත්තේ නැත. ඔබ කිතුනුවෙකු වුවත් නැතත්, කොරෝනාවයිරස් වසංගතය මහත් ප්‍රහේලිකාවක් මෙන්ම සැම දෙනාම නොසන්සුන් කරන්නක් බවට පත්ව ඇත. අප මේ ගැන කල්පනා කරන්නේ සහ එයට සාර්ථකව මුහුණදෙන්නේ කෙසේද?

මෙම කෙටි සහ ප්‍රඥාගෝචර පොතෙහි, ඔක්ස්ෆඩ් සරසවියේ මහාචාර්‍යවරයෙක්, විවිධ විශ්වාස පද්ධතීන් හරහා කොරෝනාවයිරස විමසා බලමින්, ක්‍රිස්තියානි ලෝකදෘෂ්ඨිය සිදුවන්නාවූ දේ තේරුම් ගැනීමට රැකුලක් වනවා පමණක් නොව, එවැනි අවස්ථාවලදී සැබවින්ම පිළිගත හැකි බලාපොරොත්තුවක්ද දෙන බව පෙන්වා දෙයි.

*"ගැඹුරැයි, ලෙහෙසියෙන් තේරුම්ගත හැකියි, අස්වැසුමක් ලබා දෙයි. මෙම පොත, අද අප ඉදිරියේ ඇති අභියෝග වලට එකාමෙන් මුහුණ පෑමට විශාල රැකුලක් ලබා දෙයි."*

ආචාර්ය පීටර් සැන්ඩර්ස්, **CEO, ජාත්‍යන්තර ක්‍රිස්තියානි වෛද්‍ය සහ දන්ත සංගමය (ICMDA)**

*"ජෝන් ලෙනොක්ස්ගෙ හඬ තරම් පැහැදිලි සහ ප්‍රඥාගෝචර හඬක් බටහිර ලෝකයෙන් ඇසී නැත. මඳක් නැවති සිතීමට අවශ්‍ය අය, කියවිය යුතු පොත මෙයය."*

ඔස් ගිනස්, **ග්‍රන්ථ කතෘ, Unspeakable and Fool's Talk**

ජෝන් ලෙනොක්ස්, ඔක්ස්ෆඩ් සරසවියේ ගෞරව සහිතව විශ්‍රාමලත් ගණිත ශාස්ත්‍රය පිළිබඳ මහාචාර්‍ය වරයෙකි. ග්‍රීන් ටෙම්පල්ටන් විශ්ව විද්‍යාලයේ ගෞරව සහිතව විශ්‍රාමලත් සමාජිකයෙකි. එතුමා ඔක්ස්ෆඩ් සරසවියේ ක්‍රිස්තියානි භක්ති සංරක්ෂණ කේන්ද්‍රයේ අනුබද්ධ කථිකාචාර්‍ය වරයෙක් ලෙසද කටයුතු කරයි. ලෙනොක්ස්, ක්‍රිස්තියාන් ඇදහීම වෙනුවෙන් විත්තිකරුවෙක් ලෙස, රිචඩ් ඩෝකින්ස්, ක්‍රිස්ටෝෆර් හචින්ස් සහ පීටර් සඟර් වැනි අය සමඟ මෙන්ම, බොහෝ වාද වලට පෙනී සිට ඇත. එතුමා, "විද්‍යාවෙන් සියල්ල පැහැදිලි කර හැකිද?" ඇතුළු පොත් ගණනාවක් ලියා ඇත.

Colombo Theological Seminary
*Resources to the Church for the Transformation of Nations*

ISBN 978-1-78498-569-1

thegoodbook COMPANY

thegoodbook.com | co.uk

Christian Living / Social Issues